වාර්ෂික වාර්තාව
ஆண்டறிக்கை
ANNUAL REPORT

2023



කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය
පේරාදෙණිය විශ්වවිද්‍යාලය

விவசாயப் பட்டப் பின் படிப்பு நிறுவனம்
பேராதனைப் பல்கலைக்கழகம்

POSTGRADUATE INSTITUTE OF AGRICULTURE
UNIVERSITY OF PERADENIYA

වාර්ෂික වාර්තාව - 2023



කෘෂිකර්මවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය

පේරාදෙණිය විශ්වවිද්‍යාලය

දැක්ම

කෘෂිකර්මාන්තය සහ ඒ හා බැඳුණු ක්ෂෙත්‍රයන්හි පශ්චාත් උපාධි සහ පර්යේෂණයන්හි විශිෂ්ට වූ ගෝලීය තරඟකාරී මධ්‍යස්ථානයක් බවට පත්වීම.

මෙහෙවර

උසස් ගුණාත්මක බවින් යුත් පශ්චාත් උපාධි අධ්‍යාපනය සපයමින් උසස් ඵලදායි සහ නව්‍යතාවයෙන් යුත් ප්‍රමුඛ පර්යේෂණයන් දිරිගන්වමින් කෘෂිකර්මාන්තය සහ ඒ හා බැඳුණු ක්ෂේත්‍රයන්හි ප්‍රවීනතාවයෙන් හෙබි වෘත්තිකයන් බිහි කිරීම

ඉලක්ක

- සියලු පශ්චාත් උපාධි වල ගුණාත්මක භාවය සහ අදාළත්වය පවත්වාගෙන යාම
- උසස් ගණයේ ගුණාත්මක පර්යේෂණ, නව නිපැයුම් සහ ධාරිතා වර්ධන කටයුතු දිරි ගන්වමින් විශිෂ්ට පර්යේෂණ සංකස්කෘතියක් කරා මෙහෙයවීම
- ප්‍රවීණ සහ කැපවීමෙන් ක්‍රියා කරන අධ්‍යයන, පරිපාලන සහ සහයක කාර්ය මණ්ඩලයකින් යුක්ත වීම
- ශිෂ්‍ය සහ ආයතනික කාර්ය මණ්ඩලය අතර උසස් වෘත්තීමය කුසලතා කුසලතා, අචාර ධර්ම, සහ යහ පැවැතුම් සහ නායකත්ව ගුණාංග ස්ථාපිත කිරීම
- දැනුම් තොරතුරු සියලු පාර්ශවකරුවන්ව වෙත ලබාදීම
- යහපාලනය ප්‍රවර්ධනය කිරීම
- කාර්යක්ෂම පරිපාලනයක් සහ තිරසාර මූල්‍ය කළමනාකරණයක් පවත්වාගෙන යාම

අධ්‍යක්ෂකතුමාගේප්‍රකාශය/සමාලෝචනය



කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය 1979 අංක 9 දරන ප්‍රඥප්තිය යටතේ මෙරට පශ්චාත් උපාධි අධ්‍යාපනයේ පුරෝගාමී ආයතනයක් වශයෙන් ස්ථාපිත කරන ලද අතර පේරාදෙණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිතව කමනාකරණ මණ්ඩලයක මග පෙන්වීම යටතේ ක්‍රියාත්මක වනු ලබයි. කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය පිහිටුවීමේ ප්‍රධාන අරමුණ වූයේ පශ්චාත් උපාධි අධ්‍යාපනය පිළිබඳ රට තුළ පවත්නා ධාරිතාවය වැඩි දියුණු කිරීමත් ශ්‍රී ලංකාවේ ශීඝ්‍රයෙන් පුළුල් වන කෘෂි කාර්මික ක්ෂේත්‍රයට අවැසි මනා පුහුණුවක් ලද විද්‍යාත්මක දැනුමෙන් සපිරි පිරිසක් බිහි කිරීමත් ය. දශක හතරකට ආසන්න කාලයක් පුරාවට කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මෙම ජාතික මෙහෙවරෙහි නියැළෙන්නේ අංග සම්පූර්ණ උසස් අධ්‍යාපන ආයතනයක් සහ පශ්චාත් උපාධි අධයාපනය සහ පර්යේෂණ කටයුතු පිළිබඳ මෙරට කලාපීය ලෝකයේ විශිෂ්ට මධ්‍යස්ථානයක් බවට පත් වෙමිනි.

වර්තමානයේදි ශ්‍රී ලංකා සුදුසුකම් රාමු මාර්ගපදේශ අනුව, කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් විද්‍යාපති උපාධි පාඨමාලා 30 ක් ද (ව්‍යාපාර පරිපාලනපතිද ඇතුළුව) (SLQF L9) සහ පාඨමාලා වැඩ හා පර්යේෂණ වශයෙන් (SLQF L10) පාඨමාලා 30 ක් ද පර්යේෂණ උපාධි (දර්ශනපති සහ දර්ශනශූරී වශයෙන්) පාඨමාලාවන් ද අධ්‍යයන මණ්ඩල 11ක් යටතේ පිරිනමනු ලබයි. තමන්ටම අනන්‍ය වූ සුවිශේෂී ඉගැන්වීම් සහිත කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ බොහොමයක්ම පාඨමාලා මෙහෙහයවනු ලබන්නේ පුළුල් ඉගැන්වීම් සහ පර්යේෂණ අත්දැකීම්වලින් පරිණත විශ්වවිද්‍යාල, රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන, ජාතික සහ අන්තර්ජාතික ආයතන සහ පෞද්ගලික ආයතනයන්හි අනුයුක්ත බාහිර කථිකාචාර්ය මණ්ඩලයක් මගිනි. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම විද්‍යා පීඨය හරහා අති නවීන තාක්ෂණික උපකරණ සහිත අංග සම්පූර්ණ විද්‍යාගාර පහසුකම් යටතේ ශිෂ්‍යයන්ට අවශ්‍ය ප්‍රායෝගික දැනුම සහ කුසලතාවය ලබාදෙයි. කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මේ වන විට අවධානය යොමු කර ඇත්තේ අධ්‍යයන දැනුම ලබාදීමට පමණක් සීමා නොවී බොහෝ නව්‍ය සහ ඵලදායක පර්යේෂණ වල යෙදෙන සිසුන් ප්‍රමාණයක් ආකර්ෂණය කරගැනීමට ය.

පසුගිය දශක හතරක කාල පරිච්ඡේදය තුළ විවිධ වූ උපාධි අධ්‍යයන පාඨමාලා හරහා ශිෂ්‍ය බදවා ගැනීමේ සැලකිය යුතු ප්‍රගතියක් ආයතනය හිමිකරගෙන ඇති අතර එය ආරම්භගේ දී සිසුන් 19 ක් වූ නමුත් මේ වන විට වාර්ෂිකව සිසුන් 500 ඉක්මවා ඉහළ ගොස් ඇත. කෘෂිකර්ම ක්ෂේත්‍රගේ ඉතා පුළුල් විෂය පරාසයක් තුළ 6000කට අධික වූ පශ්චාත් උපාධිධාරීන් මේ දක්වා මෙම ආයතනය විසින් බිහි කර ඇත. කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ශිෂ්‍ය ප්‍රජාව විවිධ විෂය ධාරා හැදෑරූ උපාධිධාරීන්ගෙන් සමන්විත වෙයි.විවිධ රටවලින් පැමිණි විදේශිය උපාධිධාරීන් මේ වන විට ඔවුන්ගේ පශ්චාත් උපාධි, කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ දී සම්පූර්ණ කර ඇති අතර තායිලන්තය සහ මාලදිවයින යන රටවලින් පැමිණිය ශිෂ්‍යයෝ වර්තමානයේ දී ඔවුන්ගේ පශ්චාත් උපාධි පාඨමාලා හදාරමින් සිටිති. කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය තම නිම්වළලු සමාජයේ පුළුල් පරාසයකට ව්‍යාප්ත කරමින් කොළඹ අග නගරෙය් දී විද්‍යාපති උපාධි 04ක් ප්‍රදානය කරන පාඨමාලාවන් අති සාර්ථකව පවත්වාගෙන යනු ලබන්නේය. ඇතැම් පශ්චාත් උපාධි ඕස්ටේලියාවේ ක්විස්ලන්ඩ් තාක්ෂණ විශ්ව විද්‍යාලය සමග ඒකාබද්ධව පිරිනමනු ලබයි.

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය බොහෝ පාඨමාලා සඳහා තම ඉගැනුම් ක්‍රමවේදය මාර්ගගත ක්‍රමයට ලබාදීමටත් ඇගයීමටත් වෙනස්වූවේය. පර්යේෂණ ආවරණ විභාගයන් ද මාර්ගගත ක්‍රමයට සම්පූර්ණ කරන ලද්දේ කිසිදු ප්‍රමාදයන් නොමැතිවය. වර්තමානයේ දී කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සියලුම අධ්‍යයන පාඨමාලා මාර්ගගත ක්‍රමයට උගන්වනුයේ අවශ්‍ය ප්‍රායෝගික පන්ති, කෙෂත්‍ර චාරිකා සහ විභාග සාමාන්‍ය ක්‍රමයට පවත්වමින් වන අතර පිරිනමනු ලබන පාඨමාලා වල ගුණාත්වය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ දැඩි උපදෙස් හා මග පෙන්වීම යටතේ කරනු ලබන විශ්වවිද්‍යාල මට්ටමේ තත්ත්ව සහතික ක්‍රමවේදයක් තුලින් සහතික කොට ක්‍රියාත්මක වේ.

මහාචාර්ය සී.එම්.බී. දෙමටවැව /අධ්‍යක්ෂක

පටුන

පිටුව

අ	හැඳින්වීම	1
ආ	ජයග්‍රහණය	4
ඇ	බාධක	4
ඈ	අනාගත සැලසුම්	4
ඉ	ජාත්‍යන්තරීකරණය	17
ඊ	කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය 2023 වර්ෂයේදී ඉලක්ක ගත තිරසාර භාවයට අදාළ වැඩසටහන්	17
කෘෂිකර්ම විද්‍යා පුස්තකාල වාර්තාව		18
මූල්‍ය ක්‍රියාකාරකම්		20
ව්‍යවස්ථාපිත වාර්තාව සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කිරීම		24
1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 108(1) ඡේදය ප්‍රකාරව පේරාදෙණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධික කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව සහ පිළිතුර		58

ආයතනයේ කළමනාකරණ මණ්ඩලය - 2023

නිලබලයෙන් පත්වන ලද සාමාජිකයින්

01 මහාචාර්ය සී.එම්. බී .දෙමටවැව මයා, අධ්‍යක්ෂ,කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
02 ඩබ්. කේ. එල් .ඊ .වල්ලාවිට මයා, ප්‍රධාන මුල්‍ය නිලධාරි, උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් නියෝජනය කිරීම සඳහා
03 කේ. ජී.පී. පුෂ්පකුමාර මයා අතිරේඛ අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය
04 ආචාර්ය ඊ.ආර්.එස්.පී. එදිරිමාන්න මයා, අතිරේඛ ලේකම් (කෘෂි තාක්ෂණ) කෘෂිකර්ම අමාත්‍යාංශය
05 ආචාර්ය කේ. එම්. ඒ.බණ්ඩාර - වන සංරක්ෂණ ජෙනරාල්, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව නියෝජනය කරමින්
06 මහාචාර්ය.ජී සේනානායක, සභාපති, ශ්‍රී ලංකා කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති සභාව
07 පී.මාලනී මිය, අධ්‍යක්ෂ ජනරාල් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
08 ආචාර්ය කේ.ඒ.සී.එච්.ඒ.කොතලාවල, අධ්‍යක්ෂ, ජනරාල්, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්ත මේන්තුව
09 ඒ.පී.පී. දිස්නා මිය,අධ්‍යක්ෂ ජනරාල්, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
10 මහාචාර්ය කේ.ඒ.එස්.එස්. කොඩිතුවක්කු මයා, කෘෂිකර්ම විද්‍යා පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
11 මහාචාර්ය පී.ජී.ඒ. පුෂ්පකුමාර, පීඨාධිපති, පශු වෛද්‍ය හා සත්ව විද්‍යා පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
12 ආචාර්ය ජී.වී.ටී.වී. වීරසූරිය, පීඨාධිපති, කෘෂිකර්ම විද්‍යා පීඨය, රජරට විශ්වවිද්‍යාලය
13 මහාචාර්ය ජේ. සි .එදිරිසිංහ, පීඨාධිපති,කෘෂිකර්ම පීඨය, වයඹ විශ්වවිද්‍යාලය
14 මහාචාර්ය පී.එම්.ඒ.එස්.කරුණාරත්න,පීඨාධිපති,කෘෂිකර්ම විද්‍යා පීඨය, සබරගමුව විශ්වවිද්‍යාලය
15 මහාචාර්ය එස්.ඩී.වන්නි ආරච්චි පීඨාධිපති, කෘෂිකර්ම විද්‍යා පීඨය,රුහුණු විශ්වවිද්‍යාලය
16 පී. ප්‍රෙමන්ද්‍රරාජා,පීඨාධිපති,කෘෂිකර්ම විද්‍යා පීඨය, නැගෙනහිර විශ්වවිද්‍යාලය
17 ආචාර්ය එස් වසන්තරූබා,පීඨාධිපති, කෘෂිකර්ම පීඨය, යාපනය විශ්වවිද්‍යාලය
18 ප්‍රභාත් විමල් කුමාර මයා, ලේකම්/අධ්‍යක්ෂ ශ්‍රී ලංකා කෘෂිකර්ම පරයේෂණ ප්‍රතිපත්ති කවුන්සිලය

<u>කෘෂිකර්ම පීඨයෙන් තෝරාපත්කරණ ලද සාමාජිකයින්</u>

19 මහාචාර්ය එස්.ඒ.සී.එන්.පෙරේරා මිය,කෘෂි ජීව විද්‍යාව පිළිබඳ අධ්‍යයන මණ්ඩලය, පේරාදෙණිය විශ්වවිද්‍යා
20 මහාචාර්ය ඩි.වී.පී.ප්‍රසාද, කෘෂි ආර්ථික විද්‍යාව පිළිබඳ අධ්‍යයන මණ්ඩලය
21 මහාචාර්ය එම්.අයි.එම්.මවුජුඩ්,කෘෂි ඉංජිනේරු විද්‍යාව පිළිබඳ අධ්‍යයන මණ්ඩලය.
22 ආචාර්ය යූ.අයි.දිසානායක මිය, කෘෂිකර්ම ව්‍යාප්තිය පිළිබඳ අධ්‍යයන මණ්ඩලය.
23 මහාචාර්ය ජේ.කේ.විදානාරච්චි මයා, සත්ව විද්‍යාව පිළිබඳ අධ්‍යයන මණ්ඩලය.
24 මහාචාර්ය බී.එම්.එල්.ඩී.බී.සුරියගොඩ, ජීව සංඛ්‍යාන විද්‍යාව පිළිබඳ අධ්‍යයන මණ්ඩලය.
25 ආචාර්ය එස්.ඩී.එස්.හේමචන්ද්‍ර, ව්‍යාපාර පරිපාලය පිළිබඳ අධ්‍යයන මණ්ඩලය.
26 මහාචාර්ය සී.කේ.බෙනරගම,භෝග විද්‍යාව පිළිබඳ අධ්‍යයන මණ්ඩලය
27 පී.සී.අරම්පත් මයා, ආහාර විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ අධ්‍යන මණ්ඩලය
28 මහාචාර්ය කේ.එස්.හේමචන්ද්‍ර, පැලැටි ආරක්ෂණ පිළිබඳ අධ්‍යයන මණ්ඩලය
29 මහාචාර්ය ආර්.එස්.ධර්මකීර්ති මයා, පාංශු විද්‍යාව පිළිබඳ අධ්‍යන මණ්ඩලය

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කරන ලද සාමාජිකයින්

30 ආචාර්ය කේ.එම්. මොහොට්ටි, අධ්‍යක්ෂ, තේ පර්යේෂණ ආයතනය
31 මහචාර්ය ආර්.පී.ද.සිල්වා, උපකුලපත් වෘත්තිය හා තාක්ෂණ විශ්වවිද්‍යාලය
32 මහාචාර්ය ජී.විකුන්තන්, කෘෂි ජීව විද්‍යා දෙපාර්තමේන්තුව, යාපනය විශ්වවිද්‍යාලය
33 මහාචාර්ය එච්.එම්.ඩබ්ලිව්.ඒ. හේරත් ආර්ථික විද්‍යාව සහ සංඛ්‍යාන අධ්‍යන අංශය,පේරාදෙණිය විශ්වවිද්‍යාලය
34 මහාචාර්ය ගාමිණි සේනානායක, සම්මානිත මහචාර්ය
35 ටී.එස් ජයසූරිය, වරලත් ගණකාධිකාරි

වගුව

පිටුව

ආ .1	සම්පත් සහ ශිෂ්‍යයින් පිළිබඳ තොරතුරු	5
ආ .2	පශ්චාත් උපාධි පාඨමාලා හදාරන දේශීය ශිෂ්‍යයන් පිළිබඳ තොරතුරු	5
ආ .3	උපාධි පාඨමාලාවල නියැලෙන විදේශීය ශිෂ්‍යයින් පිළිබඳ තොරතුරු	6
ඇ	කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු	7
ඇ. 1 (අ)	යොමුකරන ලද සඟරාවල (සුවිගත හා සුවිගත නොකළ) ප්‍රකාශන ලේඛණය - 2023	8
ඇ. 1 (ආ)	සුවිගත සඟරාවල පල කරන ලද සම්පූර්ණ පර්යේෂණ වාර්තා ලේඛණය - 2023	8
ඇ .2	2023 වර්ෂයේදී ලද ජාතික හා අන්තර් ජාතික සම්මාන	12
ඇ .3	2023 වර්ෂයේ මහ ජනතාවට දැනුම සන්නිවේදනය කිරීම පිළිබඳ තොරතුරු	14
ඇ.4	ආයතනය ලද සහයෝගී ශිෂ්‍යත්ව සහ පුහුණු වැඩසටහන් (දේශීය හා විදේශීය) 31.012.2023 දිනට - SAWA සහයෝගිතාවය	16
ඇ.5	2023 වර්ෂයේ ලද පේටන්ට් බලපත්‍ර විස්තර	16
ඉ. 1	පවත්වන ලද අන්තර්ජාතික සම්මාන්ත්‍රණ සහ වැඩමුලු පිළිබඳ විස්තර	17
ඉ .2	2023 වර්ෂයේ දී උපාධි අපේක්ෂක පාඨමාලා ඉගැන්වීම් / පශ්චාත් උපාධි පාඨමාලා ඉගැන්වීම් / පරිසංවාද වැඩමුලු සඳහා වූ ජාත්‍යන්තර කාර්යමණ්ඩලය පිළිබඳ තොරතුරු	17

වාර්ෂික වාර්තාව - 2023

කෘෂිකර්මවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය
පේරාදෙණිය විශ්වවිද්‍යාලය
(2023 දෙසැම්බර් 31 දිනට)

(අ) හැඳින්වීම

කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනය 1972 අංක 01 දරණ පැරණි ලංකා විශ්වවිද්‍යාල පනත යටතේ 1974 අංක 02 දරණ වයවස්ථාව මඟින් 1975 වසරේ ජූනි මාසයේ දී ස්ථාපිත කොට ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයට අනුබද්ධ ආයතනයක් බවට පත් කරන ලදි. 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ විධි විධානවලට යටත්ව ඉහත සඳහන් ව්‍යවස්ථාව ආඥ පනතක් ලෙස සලකා කොමිෂන් සභාව විසින් 1979 අංක 9 දරණ පනත පැනවීමෙන් අනතුරුව එය 1980 ජනවාරි පළමු දින සිට ක්‍රියාත්මක තත්වයට පත් වී ආයතනගේ ක්‍රියාකරිත්වය සඳහා නීතිමය පදනම සකස්කර දෙනු ලබයි. පශ්චාත් උපාධි අධ්‍යාපනය සඳහා මෙරට තුළ ඉඩ ප්‍රස්ථාවන් වර්ධනය කිරීම හා මෙරට ශීඝ්‍රයෙන් පුළුල්වන කෘෂිකර්ම ක්ෂේත්‍රයට නිසි ලෙස පුහුණු කළ විද්‍යාත්මක පුද්ගලයන් දායාද කිරීම මෙම අද්විතිය ආයතනය නිර්මාණය කිරීමේ ප්‍රධාන අරමුණු විය. මෙම ආයතනය පේරාදෙණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධව පවති.

අධ්‍යයන වැඩසටහන්

කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනය එහි ඉලක්කයන් සාක්ෂාත් කරගැනීම සඳහා වත්මන් ශ්‍රී ලංකාවේ ආර්ථිකයට වැදගත්කමින් යුතු විවිධ උසස් උපාධි පාඨමාලාවන් සකස් කොට ඇත. වර්තමානය වන විට මෙම ආයතනය දර්ශනශූරී, ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ආචාර්ය උපාධිය, දර්ශනපති සහ විද්‍යාපති උපාධී පාඨමාලාවන් 30 ක පාඨමාලා කටයුතු සහ පර්යේෂණ ද ඇතුලත්ව ප්‍රදානය කරනු ලබයි. මීට අමතරව 1998 වර්ෂයේ පටන් වෘත්තිකයන් උදෙසා ව්‍යාපාර පරිපාලනපති උපාධිය ද ප්‍රදානය කරනු ලබයි. කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනය එහි උපාධි වැඩසටහන්වල දී පූර්ණ කාලීන නේවාසික පුහුණුව කෙරෙහි වැඩි අවධානයක් යොමුකරයි. මේ තුළින් පශ්චාත් උපාධි සිසුන්ට ඔවුන්ගේ විශ්ව විද්‍යාල අධ්‍යයන කාලය උපරිම වශයෙන් ප්‍රයෝජන ගැනීමට සහ පර්යේෂණ වැඩ සටහන්වලට පූර්ණ වශයෙන් සහභාගිවීමට හැකිවනු ඇත. අධ්‍යයන හා පර්යේෂණ කටයුතුවලට සැලකිය යුතු කාලයක් කැපකරන සහ අදාළ ක්ෂේත්‍රයහි වැඩි ප්‍රාගුණ්‍යක් අත්කර ගැනීමට කැප වූ විනය ගරුක සහ වෙහෙස වී කටයුතු කරන සිසුන් පිරිසක් බිහි කිරීමේ වැදගත් අභියෝගයට කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මුහුණ දී සිටී. එවැනි කැපවීම් තුළින් ආයතනයේ උපාධිධාරීන් තුළ ඔවුන්ගේ චරිතවල අවියෝජනීය වූ කොටසක් බවට පත්වන ප්‍රබල කාර්ය ආචාරධර්ම සමූදායක් සංවර්ධනය කිරීම මෙම ආයතනයේ අපේක්ෂාවයි.

ශ්‍රී ලංකා සුදුසුකම් ආකෘතික මාර්ගෝපදේශයන්ට සමාන වන ආකාරයෙන් මෙම ආයතනය දැනට පවතින රෙගුලාසි සංශෝධනය කොට ඒ අනුව සිසුන් ඇතුළත් කරගන්නා ලදි. මෙම ආයතනය මඟින් ප්‍රදානය කෙරෙන උපාධි වැඩ සටහන් වන්නේ,

- ❖ විද්‍යාපති/ව්‍යාපාර පරිපාලනපති - පාඨමාලා වැඩ සහ සම්මාන පහක් ඉලක්ක කළ අධ්‍යයන/ව්‍යාපෘති
- ❖ විද්‍යාපති පර්යේෂණ/ව්‍යාපාර පරිපාලනපති - වසරක පර්යේෂණයක් ඇතුළත් පාඨමාලා වැඩ හා පර්යේෂණ
- ❖ දර්ශනපති / දර්ශණශූරී ව්‍යාපාර පරිපාලන ආචාර්ය උපාධි - පර්යේෂණ මත පදනම් වූ

උක්ත විද්‍යාපති උපාධි සඳහා ලියාපදිංචි වූ සිසුන්ගෙන් අදාළ සම්මාන අවශ්‍යතාවන් සපුරන අපේක්ෂකයින්ට early exit ලෙස පශ්චාත් උපාධි ඩිප්ලෝමා හෝ පශ්චාත් උපාධි සහතික පත්‍ර මට්ටමේ පාඨමාලා සම්පූර්ණ කල හැකිය. සම්මාන 25ක් ලබාගන්නා සිසුන්ට පශ්චාත් උපාධි ඩිප්ලෝමාවද සම්මාන 20ක් ලබාගන්නා සිසුන්ට පශ්චාත් උපාධි සහතික පත්‍ර ද ලබාගත හැක. කෙටි කාලයකින් පශ්චාත් උපාධි සුදුසුකම

අත්කරගැනීමට අවශ්‍ය කරන අපේක්ෂකයින් වෙනුවෙන් මෙම ආයතනය පශ්චාත් උපාධි සහතික පත්‍ර ලබා ගැනීමේ අවස්ථාව හදුන්වාදුන් ප්‍රථම අවස්ථාව මෙයයි.

ආචාර්ය මණ්ඩලය

කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය පුළුල් ඉගැන්වීමේ හා පර්යේෂණ අත්දැකීම්වලින් සමන්විත 350 දෙනෙකුගෙන් සමන්විත වන අතර ඔවුන්ගෙන් බොහෝ දෙනෙකු පේරාදෙණිය කෘෂි විද්‍යා පීඨයට අයත්වන අතර ඉතිරි පිරිස විශ්වවිද්‍යාල පද්ධතියේ වෙනත් පීඨවලින් රජයේ දෙපාර්තමේන්තු, පර්යේෂණ ආයතන සංස්ථා පෞද්ගලික අංශයේ ආයතන, අන්තර් ජාතික ආයතන හා රාජය නොවන සංවිධානවලට අයත්වේ.

අධ්‍යයන මණ්ඩල 11ක් යටතේ සිසුන් 304 දෙනෙකු 2023 අධ්‍යයන වසරේ දී ලියාපදිංචි වූ අතර ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

විද්‍යාපති - 273 ව්‍යාපාර පරිපාලනපති - 14 දර්ශනපති - 06 දර්ශනශූරි - 07

2023 වසරේ දී උපාධි ප්‍රදානෝත්සවයේදී සිසුන්ට උපාධි පිරිනමන ආකාරය පහත පරිදිය.

දර්ශනශූරි - 11 දර්ශනපති- 05 විද්‍යාපති -13

විද්‍යාපති (පාඨමාලා හා පර්යේෂණ)- 13 විද්‍යාපති (පාඨමාලා) -138 ව්‍යාපාර පරිපාලනපති - 16

පශ්චාත් උපාධි ඩිප්ලෝමා-24

වාර්ෂික සම්මේලනය

කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 35 වැනි වාර්ෂික සම්මේලනය 2023 නොවැම්බර් මස 17 යන දිනයෙදි පවත්වන ලදි. පාංශු විද්‍යා අධ්‍යයනාංශයේ මහාචාර්ය ඩබ්. එස් .දන්දෙණිය සමුළුවේ සම්බන්ධිකාරක ලෙස කටයුතු කරන ලදි.


සමුළුවේ සමාරම්භක සැසිය උත්කර්ෂවත් වූවේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ උපකුලපතිතුමා, නියෝජ්‍ය උපකුලපතිතුමා, සියළු පීඨවල පීඨාධිපතිවරුන්, ශ්‍රී ලංකා සහා මාල දිවයිනේ USAID MISSION අධ්‍යක්ෂතුමා වන ග්‍රේබ්‍රියල් ග්‍රෝව් මහතා නියෝජනය කළ නියෝජ්‍ය අධ්‍යක්ෂ ශ්‍රී ලංකා සහ මාල දිවයිනේ USAID MISSION වෙබ්රා මොසෙල් මෙනවිය සහ ආරාධිත දේශක වශයෙන් සහභාගි වූ කැනඩාවේ එඩ්මන්ටන්හි ඇල්බ(ර්)ටා විශ්වවිද්‍යාලයේ ගෝ(ර්)ඩන් ගව් මහතා යන අයගේ සහභාගිත්වයෙනි.

පකිස්තානය හා බටහිර ඉන්දියානු රටවල අන්තර්ජතික ආයතනවල පර්යේෂණ සිසුන් ඇතුළුව දේශිය හා විදේශිය පර්යේෂණ සිසුන්ගෙන් පර්යේෂණ වාර්තා 44 ක් ලැබී තිබුණි.සමාලෝචනයෙන් පසුව වාචික වාර්තා 30ක් සමුළුවේදි ඉදිරිපත් කරනු ලැබුවේ තාක්ෂණික සැසි 06 ක් යටතේය. පොස්ටර් ඉදිරිපත් කිරීම් 08 කි. ඒ අතරින්, ඉතා ඉහළ ඉදිරිපත් කිරීම වෙනුවෙන් ත්‍යාග 14 ක් පිරිනමන ලදි.

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යයන මණ්ඩල 11 ම නියෝජනය වන පරිදි පෝසටර් තරඟයක් සංවිධානය කරන ලද අතර සත්ව විද්‍යා අධ්‍යනාංශය මෙහිදි ජයග්‍රහණය කරන ලදි.

අංකුර විද්‍යාඥයින් විසින් සන්නිවේදන කුශලතා වැඩි දියුණු කිරීම සහ විද්‍යාත්මක සොයාගැනීම් ඵලදායි ලෙස ව්‍යාප්ත කිරීම සඳහා, ප්‍රකාශන සහ ඉදිරිපත් කිරීම සම්බන්ධව විවිධ මාතෘකා යටතේ පූර්ව සම්මේලන වැඩ මුළු හතරක් ද පවත්වන ලදි. මෙම වැඩ මුළු හා තාක්ෂණික සැසි සඳහා විශාල සහභාගිත්වයන් දක්නට ලැබුණි.

ආයතනික ව්‍යුහය



කෙටි යෙදුම්:

SAB – ජ්‍යෙෂඨ සහකාර මූල්‍යාධිකාරී

SAL - ජ්‍යෙෂඨ සහකාර පුස්තකාලාධිපතිනය

SA/P – පද්ධති විශ්ලේෂක

AR – සහකාර ලේඛකාධිකාරී

AL - සහකාර පුස්තකාලාධිපතිනය

*අධ්‍යයන මණ්ඩල

කෘෂිකාර්මික ජීවවිද්‍යාව
කෘෂිකාර්මික ආර්ථික විද්‍යාව
කෘෂිකාර්මික ඉංජිනේරු
කෘෂිකාර්මික ව්‍යාප්තිය
සත්ව විද්‍යාව
ව්‍යාපාර පරිපාලනය
ජීව විද්‍යා සංඛ්‍යානය
භෝග විද්‍යාව
ආහාර විද්‍යාව හා තාක්ෂණය
පැලෑටි ආරක්ෂණය
පාංශු විද්‍යාව

(ආ) ජයග්‍රහණ

ආචාර්ය ඒ. ඩබ්. ආර්. ජෝකිම් අනුස්මරණ ත්‍යාග ප්‍රදානය

2001 වසරේදී ආරම්භ කරන ලද ආචාර්ය ඒ. ඩබ්. ආර්. ජෝකිම් අනුස්මරණ ත්‍යාගය අවසන් වසර අවබෝධතා පරීක්ෂණයේදී සාර්ථකව මුහුණ දෙන ඉහළම GPA අගයක් ලබාගන්නා ප්‍රශංසනීය ශිෂ්‍යයාට ප්‍රදානය කරන්නකි. 2023 වර්ෂයේ නොවැම්බර් 17 වැනි දින පැවති 35 වැනි වාර්ෂික සමුළුවෙදී තම උපාධි පාඨමාලාවේ ඉහළම GPA අගය ලබාගත් පහත සඳහන් සිසුන්ට මුදල් ත්‍යාගය පිරිනමන ලදි.

නම	අධ්‍යයන මණ්ඩලය	උපාධි පාඨමාලාව
ජී.නිරෝෂ් මයා (19114)	කෘෂිකාර්මික ඉංජිනේරු	පාරිසරික පාංශු විද්‍යාව පිළිබඳ විද්‍යාපති පාඨමාලාව
ඩබ්.බී.ඩබ්.එම්.ආර්.සි.පි.අළුවිහාරේ (118043)	භෝග විද්‍යාව	භූමි අලංකාරය පිළිබඳව විද්‍යාපති පාඨමාලාව

(ඇ) බාධක

අධ්‍යයන කටයුතු පර්යේෂණ කටයුතු සහ ශිෂ්‍ය බඳවාගැනීම් කටයුතු වලට මාස කිහිපයක් පුරා ඇදි ගිය බදු ආශ්‍රිත ගැළුව නිසා බාධා සිදුවුණි.

(ඈ) අනාගත සැලසුම්

1 ආයතනයේ වෙබ් අඩවිය නිරන්තර යාවත්කාලීන කිරීම තුලින් දෘෂ්‍යතාවය වර්ධනය කිරීම සහ කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පුවත්පත් ලිපි/ කාලීන ප්‍රකාශන නියමිත කාල පරාසය තුල ප්‍රකාශනය කිරීම හා සාමාන්‍ය සහ විද්‍යුත් මාධ්‍ය හරහා ඒවා බෙදා හැරීම තුලින් සියළුම පාඨමාලා සඳහා වාර්ෂික ශිෂ්‍ය ලියාපදිංචිය ඉහළ දැමීම

2 ස්වයං මූල්‍ය ආයතනයක් ලෙස වගවීම සහ තිරසාර භාවය සඳහා මූල්‍ය කළමණාකරණ පද්ධති පිළිබඳ ගැඹුරු විශ්ලේෂණයක් සිදු කිරීම.

3 සිසුන්ගේ හා කාර්ය මණ්ඩලයේ විකාශනය වන අවශ්‍යතා සපුරාලීමට ඇතා හැකියාව සඳහ ශිෂ්‍ය කළමණාකරන පද්ධතිය සහ සමස්ථ පරිපාලන පද්ධතිය තක්සේරු කිරීම.

4 විදේශිය විශ්වවිද්‍යාල, පර්යේෂන මධ්‍යස්ථාන සහ කර්මාන්තකරුවන්ගේ අධ්‍යයන කටයුතු වැඩි දියුණු කිරීම උදෙසා උපාධි පාඨමාලා දෙමුහුන් පිරිනැමීම සඳහා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ පහසුකම් වැඩි දියුණු කිරීම.

5 ගෘහස්ථ ප්‍රකාශන ධාරිතාව ශක්තිමත් කිරීම සහ සමකාලීන නැවත සමාලෝචනය කරන ලද සහ සුවිගත කළ විද්‍යාත්මක සඟරා සඳහා ප්‍රවේශය පුළුල් කිරීම මඟින් පශ්චාත් උපාධි සිසුන්ගේ පර්යේෂණ ප්‍රතිදානයන් සාමාන්‍ය ජනතාව වෙත බෙදාහැරීමට පහසුකම් සැලසීම.

6 අති නවීන කෘෂිකාර්මික පර්යේෂණ සඳහා මූල්‍ය පහසුකම් සැපයීම.

7 කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ඉපැයීම් හරහා ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතියේ පර්යේෂණ සඳහා සුදුසුකම් ලත් මානව සම්පත් සඳහා සහය වීම.

8 කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වත්මන් කාබන් මුද්‍රණය පිළිබඳ පුළුල් විගණනයක් සිදු කිරීම.

9 විෂය මාලාවට සහ පර්යේෂණ වැඩ සටහන් වලට තිරසාර බව එකාබද්ධ කිරීම.

10 තිරසාර මුල පිරීම් සඳහා හවුල්කාරිත්වය පෝෂණය කිරීමට.

11 පශ්චාත් උපාධි හදාරන සිසුන්ගේ ඉගැන්වීම් හා අධික්ෂණ කටයුතු සිදු කිරීම, අධ්‍යයන පාඨමාලා සංවර්ධනය සහ ඇඟයීම් කටයුතු ද නායකත්ව දියුණුව සඳහා අදාළ වන කෙටිකාලීන පුහුණු වැඩමුළු ලබාදීම වැනි කටයුතු සඳහා දේශීය හා විදේශීය වෘත්තිකයන්ගේ සහය ලබා ගැනීම.

12 පර්යේෂණ කෘති කොපිකිරීම හඳුනාගන්නා මෘදුකාංග පහසුකම්, උඩුගත කළ විඩියෝ සමඟින් ඉගැන්වීම් හා ප්‍රතිඵලදායක ඉගෙනුම් පහසුකම් සහිත නවීන උපාංග සහිත ඉගෙනුම් කළමණාකරණ පද්ධතියක් දියුණු කිරීම.

13 කැපි පෙනෙන පර්යේෂණ ප්‍රකාශන වලින් පැන නගින බලපෑම ඉලක්ක කරගත් ප්‍රකාශන සහ ජාතික /අන්තර්ජාතික පේටන් බලපත්‍ර ලබාගැනීම සඳහා පශ්චාත් උපාධිය හදාරණ සිසුන් සහ ඔවුන්ගේ අධික්ෂක වරුන් යන දෙඅංශයේම දායකත්වය හඳුනාගෙන ප්‍රතිලාභ ලබාදීම.

14 බාහිර කාර්යමණ්ඩල සහ විදේශීය සිසුන් වෙනුවෙන් නවාතැන් පහසුකම් සහ විවේක ගැනීම් පහසුම් සලසා දීම මූලික කොට ගත් යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම.

ආ) නවක ශිෂ්‍ය බඳවා ගැනීම්

ආ.1 2023 දෙසැම්බර් 31 වැනි දිනට සම්පත් සහ ශිෂ්‍යයන් පිළිබඳ විස්තර

අධ්‍යන පාඨමාලාව	මුළු ශිෂ්‍ය සංඛ්‍යාව	කාර්ය මණ්ඩල ව්‍යාප්තිය (ස්ථිර කාර්ය මණ්ඩලය පමණි)			
		අධ්‍යයන කාර්ය මණ්ඩලය	අනධ්‍යයන කාර්ය මණ්ඩලය	අධ්‍යයන සහයක කාර්ය මණ්ඩලය	මුළු ගණන
අනියම්	0	2	37	1	40
දර්ශනපති (පාඨමාලා හා පර්යේෂණ)	17				
දර්ශනපති (පර්යේෂණ)	66				
විද්‍යාපති (පාඨමාලා)	1030				
විද්‍යාපති (පාඨමාලා සහ පර්යේෂණ)	598				
ව්‍යාපාර පරිපාලනපති (පාඨමාලා)	154				
ව්‍යාපාර පරිපාලනපති (පාඨමාලා සහ පර්යේෂණ)	66				
දර්ශනශූරී (පාඨමාලා හා පර්යේෂණ)	2				
දර්ශනශූරී (පර්යේෂණ)	69				
මුළු ගණන	**2179**	**2**	**37**	**1**	**42**

ආ.2 2023 වර්ෂයේදී පශ්චාත් උපාධි පාඨමාලා සඳහා ලියාපදිංචි වූ දේශීය ශිෂ්‍යයන් පිළිබඳ විස්තර


අධ්‍යයන පාඨමාලාව	පූර්ණකාලීන/ අර්ධ කාලීන	නවක බඳවා ගැනීම් (ජනවාරි - දෙසැම්බර් 2023)			ශිෂ්‍ය බඳවා ගැනීම (2023 දෙසැම්බර් දිනට ලියාපදිංචි වූ මුළු සංඛ්‍යාව)			උපාධිධාරීන් සංඛ්‍යාව
		පිරිමි	ගැහැණු	මුළු ගණන	පිරිමි	ගැහැණු	මුළු ගණන	
අනියම්	අර්ධ කාලීන	0	0	0	0	0	0	0

දර්ශනපති (පාඨමාලා හා පර්යේෂණ)	පූර්ණ කාලීන	0	0	0	5	12	17	1
දර්ශනපති (පර්යේෂණ)	පූර්ණ කාලීන	2	7	9	20	46	66	5
විද්‍යාපති (පාඨමාලා)	පූර්ණ කාලීන	1	2	3	328	702	1030	116+11*
විද්‍යාපති		65	161	226	168	430	598	
විද්‍යාපති (පාඨමාලා සහ පර්යේෂණ)	පූර්ණ කාලීන	0	0	0	44	133	177	5
ව්‍යාපාර පරිපාලනපති (පාඨමාලා)	පූර්ණ කාලීන	4	1	5	85	69	154	11
ව්‍යාපාර පරිපාලනපති (පාඨමාලා සහ පර්යේෂණ)	පූර්ණ කාලීන	2	7	9	35	31	66	0
දර්ශනශූරී (පාඨමාලා හා පර්යේෂණ)	පූර්ණ කාලීන	0	0	0	0	2	2	1
දර්ශනශූරී (පර්යේෂණ)	පූර්ණ කාලීන	3	3	6	35	34	69	7
පශ්චාත් උපාධි ඩිප්ලෝමා	පූර්ණ කාලීන	0	0	0	0	0	0	0
මුළු එකතුව		**77**	**181**	**258**	**720**	**1459**	**2179**	**157**

* කලින් පිටවූ පශ්චාත් උපාධි ඩිප්ලෝමා දාරින්

ආ.3 2023 වර්ෂයේදී පශ්චාත් උපාධි පාඨමාලා සඳහා ලියාපදිංචි වූ විදේශීය සිසුන් පිළිබඳ

අධ්‍යයන පාඨමාලාව	පූර්ණකාලීන/ අර්ධ කාලීන	නවක බඳවා ගැනීම් (ජනවාරි - දෙසැම්බර් 2023)			ශිෂ්‍ය බඳවා ගැනීම (2023 දෙසැම්බර් 31 දිනට ලියාපදිංචි වූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව)			අදායම (රු)
		පිරිමි	ගැහැණු	මුළු ගණන	පිරිමි	ගැහැණු	මුළු ගණන	
දර්ශනශූරී	පූර්ණ කාලීන					2	2	2,157,307.30



(ඇ) කාර්ය මණ්ඩල තොරතුරු

සේවා වර්ගය	වැටුප් කේතය	2017.12.31 දිනට අනුමත	දැනට සිටින සංඛ්‍යාව
ප්‍රාථමික මට්ටම		19	
ප්‍රාථමික ශ්‍රේණිය - දක්ෂතා නැති	PL-1		8
ප්‍රාථමික ශ්‍රේණිය - අර්ධ දක්ෂතා	PL-2		4
ප්‍රාථමික ශ්‍රේණිය - දක්ෂතා	PL-3		3
ද්විතියික මට්ටම		21	
කළමණාකාර සහකාර - තාක්ෂණික නොවන	U-MN 1		15
කළමණාකාර සහකාර - තාක්ෂණික	U-MT 1		-
ආශ්‍රිත නිළධාරි - 2 වැනි කාණ්ඩය	U-MN 2		-
ආශ්‍රිත නිළධාරි - 1 වැනි කාණ්ඩය	U-MN 3		-
මාණ්ඩලික සහකාර / සුප්‍රා සහ ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික සහකාර	U-MN 4		6
තෘතීය මට්ටම		2	
අධ්‍යයන සහකාර - 2 වැනි කාණ්ඩය	U-AS 1		-
කණිෂ්ඨ විධායක/ කළමණාකරු	U-EX 1		1
අධ්‍යයන සහකාර	U-AS 2		1
ජ්‍යෙෂ්ඨ මට්ටම		13	
වෛද්‍ය නිළධාරි	U-MO 1		
ප්‍රධාන වෛද්‍ය නිළධාරි	U-MO 2		
මධ්‍යම මට්ටමේ විධායක නිළධාරින්	U-EX 2		1
මධ්‍යම මට්ටමේ විධායක නිළධාරින්	U-EX 2 (a)		1
ජ්‍යෙෂ්ඨ විධායක නිළධාරින්	U-EX 3		
කථිකාචාර්ය	U-AC 3		4
ආශ්‍රිත මහාචාර්ය	U-AC 4		-
මහාචාර්ය/ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය	U-AC 5		1

(ඇ) පර්යේෂණ නිමවුම් දත්ත

ඇ. 1. 2023 වර්ෂයේ ප්‍රකාශක නිමවුම්

ඇ.1.(අ) 2023 දී යොමුකරන ලද (සුවිගත සහ සුවිගත නොකළ) සඟරාවල ප්‍රකාශන ලැයිස්තුව

අධ්‍යක්ෂක/ කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සහ සහකාර පුස්තකාලයාධිපති හැර ආයතනයට ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩලයක් නොමැති හෙයින් සියළුම අධ්‍යයන හා පර්යේෂණ කටයුතු සිදුකරන ලබන්නේ පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩල සමාජිකයන් විසින් වන හෙයින් ඔවුන් විසින් පළකරන ලද ප්‍රකාශන පේරාදෙණිය විශ්ව විද්‍යාලය යටතේ ලැයිස්තුගත කර ඇත.

පීඨය	ප්‍රකාශන වර්ගය		සංඛ්‍යාව		වෙනත් කරුණු
			ප්‍රකාශිත දේශීය	ප්‍රකාශිත විදේශීය	
	සුවිගත සඟරාවල පළ කරන ලද සම්පූර්ණ පර්යේෂණ වාර්තා සංඛ්‍යාව			02	ආචාර්ය ඩී එන් බලගල්ල මිය පි.ජී.එන්.එන්.දයාරත්න මිය
	සුවිගත නොකරන ලද සඟරාවල පළ කරන ලද සම්පූර්ණ පර්යේෂණ වාර්තා සංඛ්‍යාව				
	යොමු නොකළ සඟරාවල පළ කරන ලද සම්පූර්ණ පර්යේෂණ වාර්තා සංඛ්‍යාව				
	සමුළු ලේඛනවල සම්පූර්ණ පර්යේෂණ පත්‍රිකා වශයෙන් පළ කරන ලද සමුළු පර්යේෂණ සංඛ්‍යාව				
	සංක්ෂිප්ත පළකිරීමේ සංඛ්‍යාව				
	පුස්තක ඡේද පළකිරීමේ සංඛ්‍යාව				
	ප්‍රකාශිත පොත් ගණන	ප්‍රකාශක විසින්			
		කතෘ විසින්			

ඇ.1 (ආ) සුවිගත සඟරාවල පළ කරන ලද සම්පූර්ණ වර්තා - 2023

සමාලෝචිත වර්ෂයේදී, කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ සිසුන් විසින් පහත සඳහන් ප්‍රකාශනයන් Tropical Agricultural Research සඟරාවේ පළ කරන ලදි. මෙම සඟරාව 1989 පටන් ආයතනය විසින්ම පළ කරන සඟරාවකි.

පර්යේෂණ ලිපියේ නම	කතෘන්ගේ නම	සම කතෘන්
34 වැනි වෙළුම 2023 1වැනි නිකුතුව		
නිවර්තන ගොවිතැන් ක්‍රම යටතේ බඩ ඉරහු, මුං ඇට සහ තක්කාලි වල ෆිනොලෝජී,වියන් වර්ධන සහ අස්වැන්න අනුකරණය කිරීම සඳහා ආකෘතිකයක් සංවර්ධනය කිරීම සහ වලංගු කිරීම.	ජේ.බී.ඩී.ඒ.පී.කුමාර	එල්.ඩී.බී.සුරියගොඩ, ඩබ්.ස්.ජේ.ද.කොස්තා එම්.එ.පී.ඩබ්.කේ.මලව් ආරච්චි කේ.එම්.ආර්.ඩී.අභයපාල, ආර්.එම්.එස්. ෆොන්සේකා

ශ්‍රී ලංකාවේ එකිනෙකට වෙනස් එළවළු වගා පද්ධති දෙකක පාංශු රසායනික ලක්ෂණ සංසන්දනාත්මක තක්සේරුව	ආර්.එස්.ධර්මකීර්ති	පී.වීරසිංහ ඩබ්.එස්.දන්දෙනිය එච්.ඒ.එන්.උපෙක්ෂානී
අනෙකුත් කේෂත්‍ර භෝග වගා කරන ගොවින් දේශගුණික විචල්‍යතාවයට ගොදුරු වීමේ අවදානම ශ්‍රී ලංකාවේ අනුරාධපුරයේ පලුගස්වැව කඳුරැල්ල සහ මහවැලි පද්ධතිය පිළිබඳ අධ්‍යයනයක්.	එස්.ඩී.එන්.එම්. සේනාධිර	එන්.ඩී.කේ.දයාවංශ ආර.පී. ද සිල්වා
Gyrinops walla වේගයෙන් ගුණ කිරීම සඳහා ද්‍රව සංස්කෘතික පද්ධතිය සංවර්ධනය කිරීම.	ඩී.බී.ආර්.කෞෂල්‍යා	ජේ.පී. ඊශ්වර එල්.ජයසිංහ
ශ්‍රී ලංකාවේ උක් අභිජනනය සඳහා Saccharum Germpasm ඇගයීම සහ ලක්ෂණ.	ඒ.එම්.එම්.එස්. පෙරේරා	ඒ.විජේසුරිය,ඒ.එන්.ඩබ්ලිව්.එස්.තුෂාරි, ඩී.පී.එස්.ටී.ජී.අත්තනායක, එන්.ඩී.විජේසුරිය
ශ්‍රී ලංකාවේ Cinnamomum විශේෂය සංලක්ෂිත කිරීම සඳහා අන්තර් සරල අනුක්‍රමික පුනරාවර්තන කාලාප, පොතු කුඩු රූප විද්‍යාව සහ මල් රූපමිතිය භාවිතා කිරීමේ හැකියාව.	පී.සී.ජී.බණ්ඩාරණායක	එච්.ඒ.බී.එම්. හතුරුසිංහ බී.එස්.බන්දුසේකර,ඩී.කේ.එන්.ජී. පුෂ්ප කුමාර, ආර්.ඒ.ඒ.කේ.රණවක,
24 වැනි වෙළුම - 2023 2වැනි නිකුතුව		
ශ්‍රී ලංකාවේ කෘෂි දේශගුණික කලාප තුනකින් ගොවා වල ඇති Myzus persicate ගහන තුනක කෘෂිකාර්මික ප්‍රතිරෝධ්‍ය ප්‍රතිරෝධි යාන්ත්‍රණයක් සහ ෆයිලෝ ජෙනිය	ජේ.පී.මාරසිංහ	එස්.එච්.පී.පී.කරුණාරත්න එස්.එස්.සුරේන්දන් කේ.එස්. හේමවන්ද්‍ර එල්.නුගලියද්ද
බාහිර කම්පනවලට එරෙහිව කුඩා කිරිගොවින්ගේ ජීවනෝපායේ ඔරොත්තු දීමේ හැකියාව: ශ්‍රී ලංකාවේ උතුරු වියලි කලාපයක් සිද්ධි අධ්‍යයනයක්.	එස්.ප්‍රසාද්	කේ.උමාසංකර්
ශ්‍රී ලංකාවේ ඉහළ මාදුරුඔය උප ජල පෝෂක ප්‍රදේශයේ වර්ෂාපතන සහ ධාරා ප්‍රවාහ ප්‍රවණතා: විවිධ සංඛ්‍යාන ක්‍රම භාවිතා කරමින් සංසන්දනාත්මක අධ්‍යයනයක්.	ආර්.ඩී.යූ.ඒ.රණසිංහ	එන්.ඩී.කේ.දායාවංශ ආර්.පී.ද.සිල්වා
ශ්‍රී ලංකාවේ විවිධ කුරුඳු විශේෂවල ඉහළ ක්‍රියාකාරී ද්‍රව වර්ණදේහ (HPLC) පැතිකඩ සහ කෂුද්‍රජීවී ක්‍රියාකරකම් සංසන්දනය කිරීම	බී.එස්.බන්දුසේකර	ඩී.කේ.එන්.ජී.පුෂ්පකුමාර පී.සී.ජී.බන්ඩාරණායක
ශ්‍රී ලංකාවේ ඇති ගස් නිවිති (Talinum triangulare) සහ කැරන් කොකු (Acrostichum aureum) හි පූර්ණ හිනොලික්, ප්‍රතිඔක්සිකාරක ක්‍රියාකාරකම් සහ අභ්‍යන්තර ජෛව ප්‍රවේශ්‍යතාව.	කේ.ජී.එල්.ආර්.ජයතුංග	පී.එස්.පේදුරුහේව ආර්.ලියනගේ
ශ්‍රී ලංකාව සඳහා වාරි කෘෂිකර්මාන්තයේ අතථ්‍ය ජලය,	ඩබ්ලිව්.සී.එස්.වනසිංහ	ඊ.ආර්.එන්.ගුනවර්ධන එම්.අයි.එම්.මෙව්ජුඩ්

ආනයන, අපනයන සහ ජල පිය සටහන් තක්සේරු කිරීම.		
04 වැනි වෙළුම - 2023 තුනවනි නිකුතුව		
ඇල්යම් සීපා එල්.(ලූනු) ගබඩා රෝග සහ ට්‍රයිකොඩර්මා ඇස්පෙරලම් සහ ට්‍රයිකොඩර්මා වෛරස්වල බලපෑම - පසු අස්වනු නෙලීමේ ගුණයමත පෙර අස්වනු ප්‍රතිකාර	එල්.එන්.ආර්. ගුනරත්න	එන්.දේශප්‍රිය ආර්.ජී.එස්.ඒ.එස්.රාජපක්ෂ එල්.එන්.ආර්.ජයරත්න
ගෙවතු හරහා ගෘහස්ථ ආහාර සුරක්ෂිතතාව සහ ආහාර විවිධත්වය ඉහළ නැංවීම: ශ්‍රී ලංකාවේ තොරාගත් දිස්ත්‍රික්කවල සිද්ධි අධ්‍යයනයක්	ඩබ්ලිව්.ඒ.එම්.ලොවේ	ඩී.කේ.එන්.ජී.පුෂ්පකුමාර එච්.එල්.ජේ.වීරහේවා ඩබ්ලිව්.ඒ.යූ.විතාරණ බී.මාරඹේ බී.වී.ආර්.පුඤ්ඤාවර්ධන ජී.එල්.එල්.පී.සිල්වා
මධුකා ලෝන්ගිෆෝලියා හි බීජ ප්‍රරෝහණය සහ බීජ පැළ වර්ධනය කෙරෙහි බීජ ප්‍රතිකාරවල බලපෑම. ලෝන්ගිෆෝලියා(මී)	එච්.ජී.එම්.කේ.කරුණාරත්න	ජේ.පී. එස්වර එම්.සී.එම්.ඉක්බාල්
ගිනියා තණකොල මත පදනම් වූ ආහාර බුදින මුල් කිරි දෙන සෞම්‍ය දෙමුහුන් කිරිගවයන්ගේ කිරි නිෂ්පාදනය සහ සීරම් පරිවෘත්තිය මට්ටම් දෙකේදී ආහාර ශක්ති අන්තර්ගතයේ බලපෑම	ඩබ්ලිව්.එම්.පී.බී.වීරසිංහ	එච්.එම්.ජී.පී හේරත් එම්.බී.පී.කේ.මහීපාල
කෘෂි පාරිසරික ප්‍රදේශවල වනාන්තර ප්‍රභවයන්ගෙන් පිටත ගස් ලෙස ගෙවතුවල ගස් සනත්වය පිළිබඳ භූගෝලීය සහ සමාජ ආර්ථික තක්සේරුවක්: ඉහළ මහවැලි ජල පෝෂක ප්‍රදේශය, ශ්‍රී ලංකාව.	එච්.එම්.බී.එස් හේරත්	ඩී.කේ.එන්.ජී.පුෂ්පකුමාර එම්.හේවාවසම් පී.වික්‍රමගමගේ
ප්‍රභාසංස්ලේෂණ,ජෛව ස්කන්ධ සහ අස්වැන්න ලක්ෂණ මත පදනම්ව ශ්‍රී ලංකාවේ හොඳම බඩ ඉරිඟු ප්‍රවේශයන් නිර්ණය කිරීම	ඒ.එන්.එම්.මුහාරක්	එම්.එම්.එම්.මූෆිත් ඒ.ඩී.එන්.ටී.කුමාර
නොමේරූ තේ(camellia sinensis L) ශාඛවල බාහිර සාලිසිල්ක අම්ලය නියහ ආතතියට ඔරොත්තු දීමේ හැකියාව)	එම්.එම්.එන්. දමයන්ති	ටී.එල්.විජේරත්න ජේ.ඩබ්ලිව්.දමුණුපොල
34 වැනි වෙළුම -2023 හතරවැනි නිකුතුව		
දැවෙන යථාර්ථය: තාප තරංග සහ භෝග නිෂ්පාදන	එල්.කේ.වීරසිංහ	
ශ්‍රී ලංකාවේ භූදකලා නිවර්තන උප කඳුකර වනාන්තරයක ශාඛ විවිධත්වය භූගත ජෛව ස්කන්ධය සහ කාබන් තොල ප්‍රමාණය	බී.එම්.බී.වීරකෝන්	එස්.පී.නිස්සංක
වල් පැලැටි විශේෂ මතුවීම,පාංශු පෝෂක ගතිය,බඩ ඉරිඟු අස්වැන්න පහත වැටීමට බලපෑම	එෆ්. ඕ.ටකීම්	කේ.ඕ.අෆින්නීත් ජේ.ඕ.අබෙයෙම්

ආදර්ශ ගෙවතු තෝරාගැනීම: දිස්ත්‍රික් විෂමතාවය ගෙවතු වර්ගීකරණය කරයි?	එන්.කුරුප්පුආරච්චි	එල්.ඩී.බී.සුරියගොඩ ඩී.කේ.එන්.ජී.පුෂ්පකුමාර. ජී.එල්.එල්.පී.සිල්වා
වැව් අවසාදිත, පංශු බාදනය අනුකරණයන් සහ ශ්‍රී ලංකාවේ පලුගස් වැව කඳුරැල්ල පද්ධතියේ උප ජල පෝෂක වල සංරක්ෂණ මැදිහත්වීම	එච්.බී. නායකකෝරාල	පී.කෞෂිණි එස්.පද්මරාජ්
තේඅස්වැන්න සහ අස්වැන්න තිරණය කිරීමේ ප්‍රමිතින් කෙරෙහි යාන්ත්‍රික තේ අස්වැනු නෙලන යන්ත්‍රවල බලපෑම	එස්.ආර්.ඩබ්ලිව්.පතිරනගේ	එම්.ඒ.විජේරත්න ඩබ්ලිව්.ඒ.ජේ.එම්.ද.කොස්තා
ශ්‍රී ලංකාවේ පහත රට වියළි කලාපයේ වගා කරන තොරාගත් කව්පි ප්‍රභේද වල කොළ ක්‍රියාකාරි ලක්ෂණ සහ අස්වැන්න කෙරෙහි මල් පිපෙන අවධියේ මෘදු ජල ආතතියේ බලපෑම	එන්. ගීකියනගේ	අයි.විජේරත්න එම්. ප්‍රියරත්න එල්.කේ.වීරසිංහ එම්.ඒ.පී.ඩබ්ලිව්.කේ.මලව්ආරච්චි ඩී.පී.කුමාරතුංගගේ යූ. දේවසිංග එස්.රත්නායක
ශ්‍රී ලංකාවේ කුඩා තේ වතු සංවර්ධන සමිතිවල කාර්යක්ෂතාව කෙරෙහි සාමුහික ක්‍රියාකරිත්වයේ බලපෑම	කේ.ජී.ජේ.පී.මහින්දපාල	එම්.ඩබ්ලිව්.ඒ.පී.ජයතිලක එල්.එන්.ඒ.සී.ජයවර්ධන එම්.විජේරත්න
ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ සෘතුමය දේශගුණික වෙනස්කම් හේතුවෙන් සහල් දුඹුරු පැහැ පත්‍ර ලප රෝග (බයිපොලරිස් ඔරයිසා)	ටී.ඩී.සී.ප්‍රියදර්ශනී	ඩබ්ලිව්.එම්.ඩී.එම්.වික්‍රමසිංහ ඩබ්ලිව්.සී.පී.එගොඩවත්ත ඩී.අයි.ඩී.එස්.බෙනරගම ජී.ඩී.එන්.මැණිකේ පී.ඒ.වීරසිංහ ඩී.ඒ.යූ.ඩී.දේවසිංහ
ශ්‍රී ලංකාවේ තොරාගත් සහල් වගා කරන ලද පසෙහි PH සහ CE විචල්‍යතාවය	එල්.ඩී.බී. සුරියගොඩ	කේ.එච්.බී.එච්.දෙල්ගොඩ එස්.සුගත් එන්.ඒ.එස්.ඒ.නෙත්තසිංහ ඊ.ඩී.සී.ටී.චන්ද්‍රසේකර ඩී.එම්.එස්.බී.දිසානායක එම්.ආරියරත්න එම්.මාරඹේ ඩී.එන්.සිරිසේන යූ.රත්නායක එච්.කේ.කඩුපිටිය
මලකඩ ප්‍රතිරෝධී ජාන ඇතුලත් කිරීම හරහා පොදු බෝංචි වල මලකඩ ප්‍රතිරෝධය සඳහා දේශීය සංවර්දනය කිරීම	එච්.එම්.පී.එස්.කුමාරි	සි.කේ.වීබැද්ද එම්.ඒ.පාස්ටර්) කොරෙල්ස් ආර්.ජී.ඒ.එස්.රාජපක්ෂ පී.සී.ජී.බණ්ඩාරණායක
පසෙහි නට්‍රිකරණය මැඩ පැවත්වී ම සඳහා සැකසූ කුරුඳු සහ පොංගම්මියා පින්නටා (Pongamia Pinnata) කොල භාවිතා කරමින් උද්භිද විද්‍යාත්මක සුත්‍රගත කිරීමක් සංවර්ධනය කිරීම	ඩබ්ලිව්.එස්.දන්දෙනිය	ඒ.එම්.ඩයස්

(ඇ).2. 2023 දී ලද ජාතික හා ජාත්‍යන්තර සම්මාන

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික සමුළුව-2023

සැසිය	සාහිත්‍ය/හොඳම පත්‍රිකාව ජයග්‍රහණ කළ පර්යේෂණ කෘතියේ නම සහ අවුණි	ජාතික/අන්තර්ජාතික	නම/ නම	තනතුර	පීඨය/ දෙපාර්තමේන්තුව
34 වැනි වෙළුම					
කෘෂිකාර්මික යෙදවුම් සහ සේවා	හොඳම ප්‍රදර්ශනය	ජාතික	ඒ.එන්. තිසේරා	ශිෂ්‍ය	ආහාර විද්‍යාව හා තාක්ෂණ අධ්‍යනංශය
පෝෂණ හා ක්‍රියාකාරී ආහාර සහ ආහාරවල ගුණාංග	හොඳම ප්‍රදර්ශනය	ජාතික	ජී.ඩී.එස්.පී. රාජපක්ෂ	පර්යේෂණ සහකාර	සත්ව විද්‍යා දෙපාරතමේන්තුව කෘෂිකර්ම විද්‍යා පීඨය
නිරසාර භෝග නිෂ්පාදනය සඳහා කෘෂිකාර්මික පෙළඹවීම	හොඳම ඉදිරිපත් කිරීම	ජාතික	එම්.කේ .එන් .ඩබ්ලිව් ජයරත්න	පර්යේෂණ සහකාර	පංශුවිද්‍යා දෙපාරතමේන්තුව කෘෂිකර්ම විද්‍යා පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
කෘෂිකර්මාන්තයේ අවකාශීය විශ්ලේෂණය සහ ආකෘති නිරිමාණය	හොඳම ඉදිරිපත් කිරීම	ජාතික	ආර්.ඒ.ඒ.එස්. රත්නායක	දේශක	කෘෂිකර්ම ඉංජිනේරු දෙපාර්තමේන්තුව කෘෂිකර්ම විද්‍යා පීඨය,/පංශුවිද්‍යා දෙපාර්තමේන්තුව/,රුහුණු වි.වි.
වඩා හොඳ බෝග නිෂ්පාදනය සඳහා කෘෂිකාර්මික මැදිහත්වීම	හොඳම ඉදිරිපත් කිරීම	ජාතික	කේ.එල්.එස්. තමාලි	දේශක	ජීව විද්‍යාව දෙපාර්තමේන්තුව, කෘෂි විද්‍යා පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
කර්යක්ෂම සම්පත් කළමණාකරණය සඳහා තාක්ෂණික විසඳුම්	හොඳම ඉදිරිපත් කිරීම	ජාතික	යූ.ඩබ්ලිව්.එල්.එම් කුමාරසිරි	පර්යේෂණ නිලදාරි	භෝග පර්යේෂණ අංශය,උක් පර්යේෂණ ආයතනය, කෘෂි විද්‍යා පීඨය,

					පේරාදෙණිය විශ්වවිද්‍යාලය
සමාජය සහ ආහාර පද්ධතිවල තොරතුරු තාක්ෂණය	හොඳම ඉදිරිපත් කිරීම	ජාතික	ආර්.එම්.එච්.වී රාජපක්ෂ	ශිෂ්‍ය	කෘෂි කර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ආදී ශිෂ්‍ය සංගම් සම්මානය	කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ආදි ශිෂ්‍ය සංගමයේ ත්‍යාගය - තුන්වන ස්ථානය	ජාතික	යූ.ඩබ්ලිව්.එල්.එම් කුමාරසිරි	පර්යේෂණ නිලධාරි	භෝග පර්යේෂණ අංශය,උක් පර්යේෂණ ආයතනය, කෘෂි විද්‍යා පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ආදී ශිෂ්‍ය සංගමයේ ත්‍යාගය	කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ආදි ශිෂ්‍ය සංගමයේ ත්‍යාගය - දෙවන ස්ථානය	ජාතික	ආර්.ඒ.ඒ.එස්. රත්නායක	දේශක	කෘෂිකර්ම ඉංජිනේරු දෙපාර්තමේන්තුව කෘෂිකර්ම විද්‍යා පීඨය,/පාංශු විද්‍යා දෙපාර්තමේන්තුව/,රුහුණු වි.වි
කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ආදී ශිෂ්‍ය සංගමයේ ත්‍යාගය	කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ආදි ශිෂ්‍ය සංගමයේ ත්‍යාගය - පලමු ස්ථානය	ජාතික	කේ.එල්.එස්. තමාලි	ශිෂ්‍ය	ජීව විද්‍යාව දෙපාර්තමේන්තුව, කෘෂි විද්‍යා පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
	සමස්ත හොඳම ඉදිරිපත් කරන්නා	ජාතික	ජී.ඩී.එස්.පී. රාජපක්ෂ	පර්යේෂණ සහකාර, කෘෂිකර්ම ජෛව තාක්ෂණ ආයතනය	සත්ව විද්‍යා දෙපාරතමේන්තුව කෘෂිකර්ම විද්‍යා පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
	Hanthana Essence තුන්වන ස්ථානය	ජාතික	පී.ජී.එච්.එන්. ධර්මසිරි	උපාධිධාරී පර්යේෂණ සහකාර	ඒකාබද්ධ උසස් පර්යේෂණ සහ අධ්‍යාපන ආයතනය සර් , ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය
	Hanthana Essence - දෙවන ස්ථානය	ජාතික	ජී.ඩී.එස්.පී. රාජපක්ෂ	පර්යේෂණ සහකාර, කෘෂිකර්ම ජෛව	සත්ව විද්‍යා දෙපාරතමේන්තුව කෘෂිකර්ම විද්‍යා පීඨය,

				තාක්ෂණ ආයතනය	පේරාදෙණිය විශ්වවිද්‍යාලය
	Hanthana Essence - පළමු ස්ථානය	ජාතික	කේ.ඒ.ටී.කේ ජයලත්	පර්යේෂණ සහකාර	තත්ත්ව සහතික මැලිබන් කිරි හා කෘෂි නිෂ්පාදන ආයතනය
	වෛද්‍ය ජොකිම් අනුස්මරණ ත්‍යාගය	ජාතික	සී.පී. අලුවිහාරේ	පර්යේෂන නිලධාරි	පසු අස්වනු කලමණාකරණ ආයතනය
	වෛද්‍ය ජොකිම් අනුස්මරණ ත්‍යාගය	ජාතික	ජී. නිරෝෂ්	දේශක(පරිවාස	කෘෂිකර්ම ඉංජිනේරු දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම විද්‍යා පීඨය,රුහුණු විශ්වවිද්‍යාලය

ඇ.3 2023 වර්ෂය තුළ මහ ජනතාව වෙත දැනුම බෙදා හැරීම පිළිබඳ විස්තර

ආයතනය	ඩැඩසටහන් වර්ගය/වැඩමුළු/පුහුණු වැඩසටහන්/ක්ෂේත්‍ර/ප්‍රදර්ශනයන්/මාධ්‍ය	ඩැඩසටහන් මාතෘකාව	සංවිධානය කිරීම සිදුවූ/දෙපාර්තමේන්තු ව/මධ්‍යස්ථාන ඒකකය	දැවැන්තු දිනය	කාලය	ඉලක්ගත කණ්ඩායම්	සහභාගි ඛුවන් සංඛ්‍යාව
කැප් නෙට් ලංකා	රටේ සම්බන්ධීකාරක කැප් නෙට් ලංකා ජාල සම්හන්ධීකාරක ලෙස සහභාගි වේ						
කැප් නෙට් ලංකා	පුහුණු වැඩමුළු අන්තර් ජාතික සමුළු (දෙමුහුන් සිදු විම)	දේශගුණික විපර්යාස සහ ජල සංවාද 2023 වර්ෂය හා ඉන් ඔබ්බට	ශ්‍රී ලංකාවේ නෙදර්ලන්ඩ් තනාපති කාර්යලය කොළඹ අන්තර් ජාතික ජල කලමණාකරණ ආයතනය සමඟ එක්ව	09 මාර්තු 2023	එක් දින	පුද්ගලික අංශයේ ප්‍රතිපත්ති සම්පාදකයින්, පර්යේෂකයින්	
කැප් නෙට් ලංකා		ජල කළමණාකරණ කමිටු 2023,යල කන්නයට පෙර රැස්වීම	ජාතික කෘෂිකාර්මික තොරතුරු සහ සන්නිවේදන මධ්‍යස්ථානය, ගන්නෝරුව	23 මාර්තු 2023	එක් දින	කෘෂිකාර්මික අමත්‍යාංශයේ නිලදාරින්,දිස්ත්‍රික් ලේකම්, කෘෂිකාමික සංවිධාන නියෝජිතයින්	
කැප් නෙට් ලංකා	දියත් කිරීමේ උත්සවය	CGIARදේශගුණයට ඔරොත්තු	අන්තර් ජාතික ජල කලමණාකරණ ආයතනය කොළඹ)	10 අප්‍රේල් 2023	එක් දින	ඉලක්ක රටවල් සෙනගල්,	119

		දීමේ මූල පිරීම.(CGIAR පැකේජය)				මොරොක්කෝ, සිම්හාවේ, කෙන්යා,පිලිපින සහ ගොවාතමාලා	
	විද්‍යාත්මක සාකච්ඡා	අතීත වාරිමාර්ග පද්ධතියේ දෝෂ,අතීතයේ පාඩම	විද්‍යා පශ්චාත් උපාධි ආයතනය,කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය	17මැයි 2023	එක් දින	විවෘත	30
	වැඩමුළුව	පාසල් වැඩසටහන්	දේශගුණික විපර්යාස	ජූලි 05 2023	එක් දින	විවෘත	27
කැප්නෙට් ලංකා විසින් සංවර්ධනය කරන ලද සිද්ධීන්							
	පුහුණු වැඩමුළුව	කුඩා කට්ටි වශයෙන් උණ බම්බු වගා කිරීම තුලින් පාංශු බාදනයපාලනය කිරීම සහ ජල සුරක්ෂිත තාවය ඇති කිරීම පිලිබඳ ප්‍රජා නායකයින් දැනුවත් කිරීම	ලංකා සංවර්ධන නවෝත්පාදන සන්ධානය සඳහා පර්යේෂණ ආයතනය(REDI) සහ රාජ්‍ය නොවන සංවිධාන කහතුඩුව,පොල්ගස් ඕවිට, කොළඹ සහ කැප්නෙට් ලංකා	02 ජූනී 2023	එක්දින	මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රජා නායකයින්	63
2023 වර්ෂයේදී ආයතනය විසින් පවත්වන සහ වැඩමුළු පිළිබඳ විස්තර							
	පුහුණු වැඩ සටහන්	වෘත්තීමය ඉංග්‍රීසි	කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය	පෙබරවාරි 2023	හය මාසික	අනධ්‍යයන කාර්යය මණ්ඩලය	
	වැඩ මුළු	ක්ෂේත්‍ර අත්හදා බැලීම් වලදි විශ්වාසදායක සහ නිවැරදි දත්ත උත්පාදනය කිරීම	වාර්ෂික සම්මේලනය කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය	27/10/2023	පැය 8	පෞද්ගලික අංශයේකෙෂත්‍ර හා තාක්ෂණික නිලධාරින්	
	වැඩ මුළු	සංඛ්‍යාන ක්‍රම භාවිතයෙන් දත්ත විශ්ලේෂණය	වාර්ෂික සම්මේලනය කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය	04/11/2023	පැය 8	පශ්චාත් උපාධි සිසුන්	
	වැඩ මුළු	ක්ෂේත්‍ර පර්යේෂණ සඳහා මූලික සංඛානය	වාර්ෂික සම්මේලනය කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය	10/11/2023	පැය 8	පෞද්ගලික හා රාජ්‍ය අංශයේ විද්‍යාවේදි මට්මමේ නිලධාරින්	

	වැඩ මුළු	ප්‍රජා සහභාගිත්වය සහ මැදිහත්වීම සමඟ කෘෂිකාර්මික පර්යේෂණ වල ගුණාත්මක භාවය ඉහල නැංවීම	වාර්ෂික සම්මේලනය කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික සම්මේලනය ... සමාජ ආරක්ෂාව පිළිබඳ පර්යේෂණ හා සංවර්ධනය පිළිබඳ ආයතනය හා එක්ව	11/11/2023	පැය 3		
	දැනුවත් කිරීමේ වැඩසටහන්	දැනුවත් කිරීමේ වැඩසටහන්	කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ විධායක නිලධාරීන්	12/12/2023	එක් දින	නව පත්වීම් ලාභීන්	
	දිශානතිය	දිශානතිය				කලමණාකරණ සහකාර	

ඇ.4 ශිෂ්‍යත්ව සමාජිකයින් හා පුහුණු වැඩසටහන් (දේශීය සහ විදේශීය)

	ලබන්නාගේ නම	දෙපාර්තමේන්තුව	තනතුර	වැඩ සටහන් වර්ගය(පශ්චාත් උපාධි/ දර්ශනපති/	වැඩසටහන් කාල සීමාව	රට
1	ජී.ජී.ඩී.අයි බණ්ඩාර මහතා	කෘෂිකාර්මික ඉංජිනේරු	ශිෂ්‍ය	පශ්චාත් උපාධි	වසර 03	කැනඩා(IDCR)
2	ඩබ්ලිව්.එම්.එන්.එල්.විරසුරිය මහත්මිය					
3	එම්.එස්.එෆ්.හුස්නා මහත්මිය					
4	ජී.කේ.එල්.වික්‍රමසිංහ මහතා	කෘෂිකාර්මික ඉංජිනේරු	ශිෂ්‍ය		වසර 03	කැනඩා(IDCR
5	ජී.එස්.එම්.සරච්චන්ද්‍ර මහත්මිය					
6	ඩබ්ලිව්.එම්.එම්.ජී.සී.එල්. ආරියරත්න මහත්මිය					
7	ඩී.එස්.කේ.එස්. පෙරේරා මහත්මිය					

ඇ.5 පේටන්ට් බලපත්‍ර පිළිබඳ විස්තර 2023

ආයතනය	වර්ගය	සංඛ්‍යාව		අදහස් දැක්වීම
		ජාතික	අන්තර්ජාතික	
ශ්‍රී ලංකාවේ තේ පර්යේෂණ ආයතනය	ගොනු කර ඇති පේටන්ට් බලපත්‍ර සංඛ්‍යාව			
	ලැබුණු පේටන්ට් බලපත්‍ර ගණන	01		
	බලපත්‍ර ලාභී විකුණා ඇති පේටන්ට් බලපත්‍ර ගණන			

(ඉ) ජාත්‍යන්තරීකරණය

(ඉ) -1 2023 වර්ෂයේදී ආයතනය විසින් පවත්වන ලද අන්තර්ජාතික සමුළු සහ වැඩමුළු පිළිබඳ විස්තර

අංකය	තේමාව	සංවිධානය කිරීම (පීඨය/අධ්‍යයන අංශය/ මධ්‍යස්ථානය/ඒකකය)	පැවැත්වූ දිනය/ කාලසීමාව	ඉලක්කගත කණ්ඩායම	සහභාගිවුවන් සංඛ්‍යාව
1	වාර්ෂික සම්මේලනය	කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය	2023 නොවැම්බර් 17	සිසුන්	එක් කණ්ඩායමක්- 200 මාර්ග ගත -60

(ඉ)- 2 2023 වර්ෂයේදී ප්‍රථම උපාධි සඳහා ඉගැන්වීම/ පශ්චාත් උපාධි ඉගැන්වීම/සම්මන්ත්‍රණ/වැඩමුළු සඳහා අන්තර්ජාතික කාර්ය මණ්ඩල පැමිණීම පිළිබඳ තොරතුරු

ආයතනය	වැඩසටහනේ නම	රට	කාර්ය මණ්ඩලය
කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය	වාර්ෂික සම්මේලනය	ට්‍රිනිඩෑඩ් සහ ටොන්ගෝ	02
		කැනඩා	01
		ඇ එ ජ (ප්‍රදාන ආරධිත අමුත්තා)	01
		ඕස්ට්‍රේලියාව	01
කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය	ආරාධිත මාහචාර්ය	ඕස්ට්‍රේලියාව	01

ඊ. 2023 වර්ෂය සඳහා ඉලක්ක කරන ලද තිරසාර බව බැඳුණු වැඩසටහන්

1. දෙමුහුන් මාදිලිය භාවිතා කරමින් පශ්චාත් උපාධි වැඩසටහන් පිරිනැමීම.
2. සම්පත් කාර්යක්ෂමතාව සඳහා කඩදාසි ලිපිකවර හා අනෙකුත් ලිපි ද්‍රව්‍ය නැවත භාවිතා කිරීම.
3. බලශක්ති කාර්යක්ෂමතාව උදෙසා පවතින සාමන්‍ය ප්‍රතිදීප්ත බල්බ වෙනුවට LED බල්බ ක්‍රමානුකූලව යෙදීම.
4. සම්පත් භාවිතය අවම කිරීම සඳහා සන්නිවේදන/ප්‍රචාරණ අරමුණු සඳහා කෙටි පණිවුඩ පද්ධති,විද්‍යුත් තැපැල පද්ධතිය සහ මාධ්‍ය වේදිකා ඵලදායී ලෙස බාවිතා කිරීම.
5. මාර්ගගත අයදුම් කිරීම්/ලියාපදිංචි කිරීම් තවදුරටත් කරගෙන යෑම
6. තිරසාරත්වය සම්බන්ධව පාඨමාලා ඒකක 100 කට වැඩි සංඛ්‍යාවක් පිරිනැමීම තවදුරටත් කරගෙන යාම

කෘෂිකර්ම පුස්තකාලය

වාර්ෂික වාර්තාව - 2023

2023 දී ලද පුස්තකාල ප්‍රතිපාදන .

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයෙන් ලද ප්‍රතිපාදනය	රු. -
පියයෙන් ලද ප්‍රතිපාදනය	රු. 412,795.82
මුළු ප්‍රතිපාදනය	රු. 412,795.82

මිලදී ගැනීම් - පොත්

2023 වර්ෂයේදී කෘෂිකර්ම පියයේ සහ කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යයන කාර්යය මණ්ඩලය විසින් තම ආයතනවල ඉගැන්වීම් කාර්ය සඳහා ගැලපෙන පරිදි නිර්දේශ කරන ලද පෙළපොත් වලින් සමන්විත පොත් 07 ක් පුස්තකාල පොත් එකතුවට එකතු කරන ලදි.

එකතුවට අළුතින් එකතු කරන ලද පොත්වල විස්තර .

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මුදල් වලින් මිලදි ගත් පොත් ගණන	පොත් 0
වටිනාකම	රු, 0
පීඨ ප්‍රතිපාදන මගින් මිලදි ගත් පොත් ගණන	පොත් 07
වටිනාකම	රු, 198, 700.00
මිලදි ගත් මුළු පොත් ගණන (කෘ.ප.උ.ආ සහ පියය)	පොත් 07
එකතුවට එක්වූ කෘ.ප.උ.ආ. නිබන්ධන ගණන	14

පරිත්‍යාග

වෙනත් පරිත්‍යාග ශිලින්ගෙන් ලැබුණු පොත් ගණන	09
වටිනාකම	රු. 11,391.00

වර්ෂය තුල පොත් සහ වාර සඟරා පරිත්‍යාග කළ වැදගත් පරිත්‍යාගශීලින්

පරිත්‍යාගශීලියා	වටිනාකම
සංගණන සහ සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, කොළඹ	රු. 456.00

වාර සඟරා

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අරමුදල් මගින් වාර සඟරා මාතෘකා එකක් සඳහා 2023 වර්ෂයෙදී දායකත්වය සපයන ලදි.

2023 දී ලියාපදිංචි පුස්තකාල පරිශීලකයින් 2609 ක් විය . විස්තර පහත දැක්වේ .

පශ්චාත් උපාධි සිසුන්	1082
උපාධි අපේක්ෂකයින්	1382
අධ්‍යයන කාර්යය මණ්ඩලය (ස්ථිර)	129
අධ්‍යයන කර්යය මණ්ඩලය (තාවකාලික)	12
සම්මානික මහාචාර්ය	01
බාහිර කථිකාචාර්ය	01
ලිපිකාර හා සමාන්තර සේවා	02
මුළු ගණන	2609

පුස්තකාල පොත් භාවිතය

බැහැර ෙගනයාෙම් අයිතම් ගණන	452
පරිශීලනය අයිතම් ෙගනයාම් ගණන	14
අැතුලත පරිශීලනය කරන ලද ගණන	585

අන්තර් පුස්තකාල ණය .

වෙනත් පුස්තකාලවලින් ලිපි/ පොත් ඉල්ලා අයදුම් 01 ක් ලැබුණි.
අපි ලිපි/ පොත් 01 ක් වෙනත් පුස්තකාලවලට යැව්වෙමු.

අපි ලිපි/ පොත් 11ක් වෙනත් පුස්තකාලවලින් ඉල්ලා සිටියෙමු.
අප වෙත ලිපි / පොත් 11ක් වෙනත් පුස්කාලවලින් ලැබිණි.

සාහිත්‍ය කරුණු සෙවීම

පීඨයේ සහ කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පර්යේෂණ සිසුන් විසින් සාහිත්‍ය කරුණු සෙවීම සඳහා කෘෂිකර්ම විද්‍යා පුස්තකාලීය ෙවීබ් අඩවිය භාවිතා කරනු ලබයි. 2023වර්ෂය තුලදි CAB සෙවීම 1 ක් සිදු කරණ ලදි.

<u>පුස්තකාල දිශාභිමුඛ කිරීමේ වැඩමුළු</u>

අනු අංකය	දිනය	ස්ථානය	සිසුන් සංඛ්‍යාව
01	22.07.2023	කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය	

එන්.සරොජිනි මිය

සහකාර පුස්තකාලාධිපති/ කෘෂිකර්ම පුස්තකාලය

09.01.2024


මූල්‍ය කාර්ය සාධනය

13. පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර

විෂය	2021 (රු.)		2022 (රු)		2023 (රු.)	
	වෙන් කරන ලද	සත්‍ය අගය	වෙන් කරන ලද	සත්‍ය අගය	වෙන් කරන ලද	සත්‍ය අගය
අ)පුද්ගලික පඩිනඩි	102,168,100	78,873,620	107,257,000	112,961,174	114,017,650	78,912,872
ආ) ගමන් වියදම්	20,000	17,990	15,000	7,910	25,000	18,161
ඇ) සැපයීම්	2,715,000	1,129,825	3,950,000	2,283,400	2,482,600	3,018,643
ඈ) නඩත්තු	1,485,000	1,571,422	1,700,000	2,167,828	2,600,000	2,020,114
ඉ)කොන්ත්‍රාත් සේවා	5,755,000	5,624,481	6,925,000	7,092,112	9,320,000	9,177,245
ඊ) වෙනත්	17,748,000	35,524,141	42,346,531	50,679,688	20,148,750	40,423,157
එකතුව	129,891,100	122,741,479	162,193,531	175,192,112	148,594,000	133,570,191
මූල්‍ය ප්‍රභවය						
රජයේ ප්‍රතිපාදන		64,507,000		52,411,000		-
%ක් වශයෙන්		53%		30%		0%
උත්පාදනය කළ මුදල්		58,234,479		112,781,112		133,570,191
%ක් වශයෙන්		47%		70%		100%

2023 වර්ෂයේදී ආයතනයේ පුනරාවර්තන වියදම් සහ ප්‍රාග්ධන වියදම් සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන නොමැත. මෙම වසරේ මුළු සත්‍ය පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් පිළිවෙලින් රුපියල් මිලියන 133.57 සහ රුපියල් මිලියන 4.3 කි. මුළු පුනරාවර්තන වියදමම මූලික වශයෙන් ජනනය කරන ලද අරමුදල් මගින් මූල්‍යකරණය කරන ලදී. පුනරාවර්තන වියදම්වලින් 59.08%ක් ස්ථීර කාර්ය මණ්ඩලයේ වැටුප් හා චේතනද කථිකාචාර්යවරුන්ගේ බාහිර දේශන ගාස්තු ද ඇතුලත්ව පුද්ගලික පඩිනඩි සඳහා වේ. පාඨමාලා ද්‍රව්‍ය, විශේෂ සේවා, විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ට ගමන් වියදම්, වාර්ෂික සම්මේලනය යනාදී ඇතුළු අනෙකුත් පුනරාවර්තන වියදම් සමාලෝචිත වර්ෂයේ මුළු පුනරාවර්තන වියදමෙන් 30.26% ක් පමණ වේ. පුනරාවර්තන වියදම්වල සංයුතිය පහත සටහනේ දක්වා ඇත.


පුනරාවර්තන වියදම් සංයුතිය - 2023



14. ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර

විෂය	2021 (රු.)			2022 (රු.)			2023(රු.)		
	වෙන් කිරීම්	රජයේ ප්‍රධාන	සත්‍ය අගය	වෙන් කිරීම්	රජයේ ප්‍රධාන	සත්‍ය අගය	වෙන් කිරීම්	රජයේ ප්‍රධාන	සත්‍ය අගය
අ) ගොඩනැගිලි හා ව්‍යුහ ප්‍රතිසංස්කරණය හා වැඩි දියුණු කිරීම්	-	-		5,000,000	-	4,842,649		-	
ආ) රසායනාගාර හා ඉගැන්වීම් උපකරණ අත්පත් කර ගැනීම	1,000,000	-	108,392	13,500,000	-	14,797,111	8,500,000	-	3,154,587
ඇ) ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ අත්පත් කර ගැනීම		-			-		2,275,000	-	580,527
ඈ) වෙනත් - පුස්තකාල පොත් හා චාර සඟරා	500,000	-	273,124	300,000	-	61,890		-	
ඉ) පරිගණක සහ මෘදුකාංග	14,500,000	3,800,000	11,209,708	15,000,000		11,676,282	5,000,000	-	567,400
ඊ) ක්‍රීඩා උපකරණ	60,000	-	-		-	-	5,000	-	4,600
එකතුව	24,910,000	3,800,000	15,804,371	34,500,000		31,728,474	15,780,000	-	4,307,114

අදාළ වර්ෂය තුළ ගොඩනැගිලි සහ ව්‍යුහයන් පුනරුත්ථාපනය කිරීම හෝ වැඩිදියුණු කිරීම සඳහා වියදම් කර නොමැත. සැබෑ මුළු වියදමෙන් 73ග24 ක් එනම් රුපියල් මිලියන 3.15 ක් වැය කරන ලද්දේ විද්‍යාගාර සහ ඉගැන්වීම් උපකරණ ලබා ගැනීම සඳහාත් විද්‍යාගාර සහ පන්තිකාමර තත්ත්වයෙන් උසස් කිරීම සඳහාත් ය. තවද මුළු ප්‍රාග්ධන වියදමෙන් 13ග48 ට සමාන වන පරිදි ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ අත්පත් කර ගැනීම සඳහා රුපියල් මිලියන 0.58 ක් වැය කරන ලදී. තවත් රු. මිලියන 0.57ක් පරිගණක රසායනාගාර වැඩිදියුණු කිරීම සඳහා පරිගණක සහ මෘදුකාංග සඳහා වැය කර ඇත.


ප්‍රාග්ධන වියදම් සංයුතිය - 2023
ඇ)පරිගණක සහ මෘදුකාංග
13.17%
අ) ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ
අත්පත් කර ගැනීම
13.48%
ආ)විද්‍යාගාර සහ ඉගැන්වීම්
උපකරණ අත්පත් කර ගැනීම
73.24%

පේරාදෙණිය විශ්ව විද්‍යාලයට අනුබද්ධ කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2023 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ මුදල් වර්ෂය සඳහා වන ව්‍යවස්ථාපිත වාර්තාව සහ මුල්‍ය ප්‍රකාශනය සකස් කිරීමේදී අනුගමනය කරන ලද වැදගත් ගිණුම් ප්‍රතිපත්ති පිළිබඳ හෙලිදරව් කිරීම.

1). පොදු කරුණු

2023 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ මුදල් වර්ෂය සඳහා වූ කෘෂිකර්මවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මුල්‍ය ප්‍රකාශනය 1979 අංක 09 දරණ කෘෂිකර්මවිද්‍යා පශ්චාත් උපාධි ආයතන ආඥා පනතේ 12(3)(ඉ) සහ 19(1) සහ 1978 අංක 16 දරණ විශ්ව විද්‍යාලපනතේ අංක 106(1) සහ 107(ආ) වගන්ති සහ ඉන්පසුව නීති ප්‍රකාරව කරන ලද සංශෝධන හා 1971 අංක 38 දරණ මුදල් පනත ප්‍රකාරව සකස් කොට ඇත.

2) අනුගමනය කරන ලද වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

2.1 ගිණුම්කරණයට මුල් වූ පදනම

මූල්‍ය ප්‍රකාශනය, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් වලින් (මූල්‍ය ප්‍රකාශන) සමන්විත ආයතනයේ මූල්‍ය වාර්තාව පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම, පිළිවෙලින් 2009,2012 සහ 2018 වර්ෂයන්හිදී ප්‍රකාශයට පත්කරන ලද අදාළ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත 1, 2 සහ 3 වන වෙළුම්, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත සහ 1971 අංක 38 දරන මුදල් පනත සහ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද උපදෙස්මාලාව අනුව උපචිත පදනම මත පිළියෙල කොට ඇත.

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මෙම වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශය සකස් කිරීමේ දී පසුගිය වර්ෂයේ අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිම අනුගමනය කොට ඇත. අවශ්‍ය තැන් වලදී ,විමර්ෂණයට භාජනය කරනු ලබන වර්ෂයට අනුකූල වන පරිදි සංසන්දනාත්මක ගැලපුම් සිදුකොට නොමැත.

3) දේපළ , පිරියත හා උපකරණ

3.1 දේපළ, පිරියත හා උපකරණ එහි ප්‍රත්‍යාගණන අගය අනුව වාර්තා කොට ඇති අතර ක්ෂය වීම් 1995 ඔක්තෝබර් 05 අංක 649 දරන විශ්වවිද්‍යාල කොමිෂන් සභා චක්‍ර ලේඛය සහ 2022 මැයි මස 05 වැනි දිනැති අංක 09/ 2022 දරන විශ්වවිද්‍යාල කොමිෂන් සභා චකලේඛය ප්‍රකාරව ගණනය කොට ඇත. මූල්‍ය කාර්යය සාධන වාර්තාවට මෙම ක්ෂය වීම් සරල මාර්ග පදනම මත ගණනය කොට ඇත.

එසේම විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාවේ චක්‍රලේඛ විධිවිධාන පරිදි දේපළ, පිරියත හා උපකරණ වල ක්ෂය අනුපාත තීරණය කොට ඇත.

දේපළ, පිරියත හා උපකරණ		ක්ෂය වීමේ අගය (වර්ෂයකට ප්‍රතිශතයක් ලෙස)
1. ගොඩනැගිලි හා ව්‍යුහයන්	-	05
2. කාර්යාලයීය උපකරණ	-	20
3. පරිගණක සහ මෘදුකාංග	-	20
4. පරිගණක උපකරණ/ උපාංග	-	20
5. ගෘහ භාණ්ඩ හා සවිකිරීම්	-	10
6. රසායනාගාර , ඉගැන්වීම් හා කාර්යාලයීය උපකරණ	-	20
7. මෝටර් රථ	-	20
8. පුස්තකාල පොත් සහ වාර සඟරා	-	20
9. ක්‍රීඩා උපකරණ	-	20
10. භූමි අලංකාර ව්‍යාපෘතිය	-	05
11. ජනක යන්ත්‍ර සහ බල සැපයුම් පද්ධති	-	10
12. ජලාපවහන හා මලාපවහන පද්ධති	-	10

යම් වත්කමක් භාවිතයට ගැනීමේ ආරම්භයත් සමඟම එය ක්ෂය වීමට පටන් ගන්නා අතර , එකී වත්කම විකිණීමට හෝ හඳුනානොගැනීමට තීරණය කරනු ලබන දිනවලින් කළින් එළැඹි දින සිට එම ක්ෂය වීම් නවතී.

3.2 කෘෂිකර්මවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය පේරාදෙණිය විශ්ව විද්‍යාලයට අනුබද්ධිත ආයතනයක් ලෙස පිහිටුවා ඇති බැවින් මෙම ආයතනය පිහිටි භූමියේ අයිතිය නීත්‍යානුකූලව එයට පවරා ගෙන නොමැත. එබැවින් ආයතනයේ මූල්‍ය ප්‍රකාශය පිළියෙල කිරීමේ දී එකී ඉඩමේ වටිනාකම සැලකිල්ලට ගෙන නොමැත.ගොඩනැගිලි වටිනාකම රු.123,778,071.38 ක් ලෙස මූල්‍ය වාර්තාවල පමණක් සඳහන්කර ඇත.

3.3 දේපල, පිරියත සහ උපකරණ 2022.01.01 දිනට ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ට අනුකූලව පන්තිය අනුව වෙන වෙනම ප්‍රත්‍යාගණන කරන ලද අතර රු. 36,361,026.48 ක් ප්‍රත්‍යාගණන අතිරික්තයක් ඇත, ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 විස්තරාත්මක සංඛ්‍යාලේඛනවලට අනුව, වත්කම්වල ප්‍රත්‍යාගණන කරන ලද ප්‍රමාණයන් මත පදනම් වූ ක්ෂයවීම් සහ වත්කම්වල මුල් පිරිවැය මත පදනම් වූ ක්ෂයවීම් අතර වෙනස ලෙස 2022.12.31 දිනට ප්‍රත්‍යාගණන අතිරික්තය මත ක්‍රමක්ෂය කිරීම හඳුනාගෙන ඇත. සටහන අංක 07 හි පැහැදිලි කර ඇත.

3.4 පර්යේෂණ ප්‍රදාන මුදල් උපයෝගි කරගෙන මිලදී ගන්නා ලද ස්ථාවර වත්කම් ඉන්වෙන්ටරියේ ඇතුළත් කර ඇති නමුත් ප්‍රදාන කාල සීමාව අවසානයේ වත්කම්වල හිමිකාරිත්වය පී.පී.අයි වෙත පැවරෙන්නේ නැති බැවින් ස්ථාවර වත්කම් ලේඛනය ඇතුලත් නොවේ. ශේෂය යාවත්කාලීනව තබා ගැනීම සඳහා වියදම් අදාළ පර්යේෂණ ප්‍රදාන ගිණුමේ සටහන් කර ඇත. පර්යේෂණ ප්‍රදාන සම්බන්ධ විස්තර සටහන එන් හි ඇතුලත්ව ඇත.

4. ජංගම වත්කම්

ශේෂ පත්‍රයේ ජංගම වත්කම් ලෙස සඳහන් වත්කම් යන්නට මුදල් සහ බැංකු ශේෂ සහ ආයතනයේ සාමාන්‍ය ක්‍රියාකාරී චක්‍රය තුළ හෝ වාර්තාකරනු ලබන දින සිට වසරක් ඇතුළත යන අවස්ථා දෙකෙන් වඩා කෙටිකාලයක් තුළ උපලබ්ධි විය හැකි යැයි අපේක්ෂිත චෙක්පත් ආදී සියල්ල ඇතුළත් වේ.

4.1 බඩු වට්ටෝරු පොත් සහ තොග

බඩු වට්ටෝරු පොත් සහ තොගවල වටිනාකම තත්‍ය පිරිවැයට අනුකූලව තක්සේරු කරනු ලැබේ. ප්‍රථමයෙන්ම ලැබ ප්‍රථමයෙන්ම නිකුත් කිරීමේ පදනම මත පිරිවැය ගණනය කරනු ලැබේ. ගිණුම් වල සඳහන් තොග ශේෂයන් තොග ගැනීමක් වශයෙන් සත්‍යාපනය කරන ලදී.

4.2 වෙළෙඳ හා වෙනත් ලැබිය යුතු දෑ

වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ සාක්ෂාත් කර ගැනීමට ඇස්තමේන්තු කර ඇති මුදල් ප්‍රමාණයන්හි දක්වා ඇත.

4.2.1 ආදායම් හඳුනාගැනීමේ ප්‍රතිපත්තිය

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 10 අනුව ආදායම් හඳුනාගැනීමේ ප්‍රතිපත්තිය සකස් කර ඇත.

උපලබ්ධි විය හැකි යැයි ඇස්තමේන්තු කරනලද ප්‍රමාණයන්ගෙන් වෙළෙඳ හා වෙනත් ලැබිය යුතු දෑ මෙහි සඳහන් කර ඇත. අදාළ කාල පරිච්ඡේදය තුළ පාඨමාලා ගාස්තු වලින් ලද ආදායම හඳුනා ගනු ඇත. ඒ අනුව පශ්චාත් උපාධි විද්‍යාපති (පාඨමාලා) , විද්‍යාපති (පාඨමාලා සහ පර්යේෂණ), ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාපති , දර්ශන ශූරී සහ දර්ශනපති යන පශ්චාත් උපාධි පාඨමාලාවල ආදායම පිළිවෙලින් අවුරුදු 1, අවුරුදු 2, අවුරුදු 2, අවුරුදු 2 සහ අවුරුදු 3 කාලයන් තුළ ආදායම් ලැබෙන බවට හඳුනාගෙන ඇත.

2023 අධ්‍යයන වර්ෂයේ ක්‍රියාකාරකම් 2023.12.31 දිනෙන් අවසන් වන මුදල් වර්ෂය තුළ ක්‍රියාත්මක කර ඇත.
වෙනත් ආදායම් මූලාශ්‍ර (සටහන අංක 15) අදාළ මූල්‍ය වර්ෂයට අදාළව හඳුනාගෙන ඇත.

73 කාලීන තැන්පතු ගිණුම - ම.බැ 0576001000025020-1	2,000,000.00	
74 ස්ථාවර තැන්පත් ගිණුම - (88307480 -1452783 ලංකා බැංකු)	5,000,000.00	
75 ස්ථාවර තැන්පත් ගිණුම - (89177057 -1752221 ලංකා බැංකු)	5,000,000.00	
76 ස්ථාවර තැන්පත් ගිණුම - ම.බැ. (0576001000028287-3)	-	
77 ස්ථාවර තැන්පත් ගිණුම - ම.බැ. (0576001000028286-4)	-	
78 ස්ථාවර තැන්පත් ගිණුම - ම.බැ. (0576001000028285-5)	-	
79 ස්ථාවර තැන්පත් ගිණුම - ම.බැ. (0576001000028283-7)	-	
80 ස්ථාවර තැන්පත් ගිණුම - ම.බැ. (0576001000028507-7)	-	
81 ස්ථාවර තැන්පත් ගිණුම - ම.බැ. (0576001000028508-6)	-	
82 ස්ථාවර තැන්පත් ගිණුම - ම.බැ. (0576001000028523-7)	-	
83 ස්ථාවර තැන්පත් ගිණුම - (8526689 -1452427 ලංකා බැංකු)	48,000,000.00	
84 ස්ථාවර තැන්පත් ගිණුම - ම.බැ. (0576001000030664-2)	-	
85 ස්ථාවර තැන්පත් ගිණුම - ම.බැ. (0576001000030665-1)	-	
86 ස්ථාවර තැන්පත් ගිණුම - ම.බැ. (0576001000031376-9)	-	
87 ස්ථාවර තැන්පත් ගිණුම - ම.බැ. (0576001000031664-0)	-	
88 ස්ථාවර තැන්පත් ගිණුම - (90114 -1452427 ලංකා බැංකු)	22,000,000.00	
89 ස්ථාවර තැන්පත් ගිණුම - ම.බැ. (0576001000032289-3)		
90 ස්ථාවර තැන්පත් ගිණුම - ම.බැ. (0576001000032291-9)	17,844,731.73	
ඉදිරියට රැගෙන ගියා	403,469,100.84	876,800,409.23

ඉදිරියට ගෙන ආවා	403,469,100.84	876,800,409.23
91 ස්ථාවර තැන්පත් ගිණුම - ම.බැ. (057600100032399-0)	27,522,173.34	
92 ස්ථාවර තැන්පත් ගිණුම - ම.බැ. (057600100032447-2)	10,000,000.00	
93 ස්ථාවර තැන්පත් ගිණුම - ම.බැ. (057600100032288-4)	-	
94 ස්ථාවර තැන්පත් ගිණුම - ම.බැ. (057600100032290-0)	-	
95 ස්ථාවර තැන්පත් ගිණුම - ම.බැ. (057600100033009-0)	-	
96 ස්ථාවර තැන්පත් ගිණුම - ම.බැ. (057600100033797-6)	-	
97 ස්ථාවර තැන්පත් ගිණුම - ම.බැ. (057600100033798-5)	-	
98 ස්ථාවර තැන්පත් ගිණුම - ම.බැ. (057600100033799-4)	-	
99 ස්ථාවර තැන්පත් ගිණුම - ම.බැ. (057600100034250-4)	17,500,000.00	
100 ස්ථාවර තැන්පත් ගිණුම - (90725615 - (2414691) ලංකා බැංකු)	4,000,000.00	
101 ස්ථාවර තැන්පත් ගිණුම - (90790951 - (2377705) ලංකා බැංකු)	-	
102 ස්ථාවර තැන්පත් ගිණුම - ම.බැ. (057600100035043-3)	25,000,000.00	
103 ස්ථාවර තැන්පත් ගිණුම - ම.බැ. (057600100035045-1)	47,000,000.00	
104 ස්ථාවර තැන්පත් ගිණුම - ම.බැ. (057600100035044-2)	73,000,000.00	
105 ස්ථාවර තැන්පත් ගිණුම - ම.බැ. (057600100035163-7)	25,000,000.00	
106 ස්ථාවර තැන්පත් ගිණුම - ම.බැ. (057600100035817-7)	33,000,000.00	
107 ස්ථාවර තැන්පත් ගිණුම - ම.බැ. (057600100035935-4)	5,000,000.00	
108 ස්ථාවර තැන්පත් ගිණුම - ම.බැ. (057600100036175-1)	6,000,000.00	
109 ස්ථාවර තැන්පත් ගිණුම - ම.බැ. (057600100036586-4)	124,700,000.00	
110 ස්ථාවර තැන්පත් ගිණුම - ම.බැ. (057600100036911-0)	90,000,000.00	
111 ස්ථාවර තැන්පත් ගිණුම - (91955289 - (2566346) ලංකා බැංකු)	22,000,000.00	
112 ස්ථාවර තැන්පත් ගිණුම - ම.බැ. (057600100037101-8)	40,000,000.00	
113 ස්ථාවර තැන්පත් ගිණුම - ම.බැ. (057600100037284-7)	80,000,000.00	
114 ලැබියයුතු ආයෝජන පොළිය	39,484,564.15	
115 ලැබියයුතු පාඨමාලා ගාස්තු	34,797,016.33	
116 ලැබියයුතු ලියාපදිංචි සහ අනෙකුත් ගාස්තු	727,100.00	
117 ලැබියයුතු ප්‍රවාහන ගාස්තු	103,126.90	
119 ලැබිය යුතු බදු ගෙවීම්	35,136.48	
120 ඇප සහ වෙනත් තැන්පතු	292,800.00	
121 තොග	2,452,677.84	
122 MBA පෙළපොත් සහ කෘ.ප.උ.ආයතනයේ ප්‍රකාශන තොග	764,134.60	
123 කාර්යමණ්ඩල ණය	18,020.00	
124 ආපදා ණය	5,095,255.13	
125 ප්‍රවාහන ණය	276,624.00	
126 උත්සව අත්තිකාරම්	-	
127 පරිගණක ණය	171,000.00	
128 අර්ථසාධක ණය	-	
129 මාර්ගස්ත පුස්ථකාල පොත්	-	
130 විශේෂ අත්තිකාරම්	-	
131 විවිධ (පොදු) අත්තිකාරම්	-	
132 ප්‍රාග්ධන අත්තිකාරම්	-	
133 මුදල් පොත් ශේෂ ගිණුම -057-1-001-3-1338027 (පුණරාවර්තන)	19,131,043.54	
134 මුදල් පොත් ශේෂ ගිණුම - 0001273337 (පර්යේෂණ)	6,455,830.74	
135 මුදල් පොත් ශේෂ ගිණුම - 0571-00-1-3-1338032 (ප්‍රාග්ධන)	2,069,051.20	
136 මුදල් පොත් ශේෂ ගිණුම - I.D.R.C. CAD 0090431789	44,818,474.72	
137 පූර්ව ගෙවීම්	82,646.47	
ඉදිරියට රැගෙන ගියා	1,189,965,776.28	876,800,409.23

ඉදිරියට ගෙන ආවා	1,189,965,776.28	876,800,409.23
138 පුස්තකාල තැන්පතු		13,926,166.75
139 විද්‍යා තැන්පතු		-
140 අවලංගු කළ චෙක්පත් ගිණුම		-
141 ඇප තැන්පතු ගිණුම		1,668.00
142 ටෙන්ඩර තැන්පතු ගිණුම		8,500.00
143 ඇප තැන්පතු ගිණුම (ලංසු බැඳුම්කර)		60,857.34
144 අනෙකුත තැන්පතු- සී.පී.සී එන් පෙරේරා (ගබඩා පාලක)		5,475.00
145 උපචිත වියදම් - භාහිර කථිකාචාර්ය ගාස්තු		35,949,968.00
146 උපචිත වියදම් - විභාග ගාස්තු ගිණුම		1,073,018.00
147 උපචිත වියදම් - විශේෂ සේවා		324,613.91
148 උපචිත වියදම් - වැටුප් හා වේතන		286,580.00
149 උපචිත වියදම් - නිවාඩු දින ගෙවීම්		7,198.50
150 උපචිත වියදම් - සන්නිවේදන වියදම්		521,018.13
151 උපචිත වියදම් - ගමන් වියදම් දේශීය		1,150.00
152 උපචිත වියදම් - සේවානියුක්තයන්ගේ භාර අරමුදල		9,756.07
153 උපචිත වියදම් - විභාග ගාස්තු (විස්ථිරණ /නිබන්ධන)		28,000.00
154 උපචිත වියදම් - ජීවනවියදම් දීමනාව		38,622.58
155 උපචිත වියදම් - අර්ථසාදක අරමුදල		48,780.38
156 උපචිත වියදම් - ආරක්ෂක සේවා		80,500.00
157 උපචිත වියදම් - විදුලි ගාස්තු		429,562.56
158 උපචිත වියදම් - අතිකාල		331,573.00
160 උපචිත වියදම් - කාර්ය මණ්ඩල සංවර්ධනය		-
161 උපචිත වියදම් - උපකරණ අලුත්වැඩියාව		55,430.00
162 උපචිත වියදම් - පර්යේෂණ ආධාර අරමුදල		-
163 උපචිත වියදම් - ජල ගාස්තු		76,152.50
164 ප්‍රතිපාදන වෙන්කිරීම - පාරිතෝෂික වියදම්		13,032,307.00
165 ප්‍රතිපාදන වෙන්කිරීම - විගණන ගාස්තු		600,000.00
166 උපචිත වියදම් - විශේෂ සේවා වෘත්තීය සහ අනෙකුත් ප්‍රතිපාදනගිණුම		171,491.47
167 උපචිත වියදම් - ඉන්ධන සැපයුම්		120,770.95
168 උපචිත වියදම් - පවිත්‍රතා සේවා		734,509.79
169 උපචිත වියදම් - නිලඇඳුම් සැපයුම්		73,425.00
170 උපචිත වියදම් - සමුලු වියදම්		304,691.00
171 උපචිත වියදම් - ගැලපුම් දීමනා		-
172 උපචිත වියදම් - මුද්දර ගාස්තු		7,050.00
173 උපචිත වියදම් - වෙනත් සැපයුම්		-
174 උපචිත වියදම් - කොළඹ ශාඛාවේ වියදම්		-
175 උපචිත වියදම් - සංග්‍රහ වියදම්		16,070.00
176 උපචිත වියදම් - මාසික දීමනා		24,758.06
177 උපචිත වියදම් - මුද්‍රණ සහ දැන්වීම්		-
178 උපචිත වියදම් - විශ්වවිද්‍යාල විශ්‍රාම		-
179 උපචිත වියදම් - සේවක සුබසාධන සහ අග්‍රහාර		25,000.00
180 උපචිත වියදම් - CAP NET ව්‍යාපෘතිය		105,400.00
181 උපචිත වියදම් - වාහන අලුත්වැඩියා		70,075.00
182 උපචිත වියදම් - ප්‍රයෝගික ගාස්තු වියදම්		-
183 උපචිත වියදම් - APN ව්‍යාපෘතිය		-
184 උපචිත වියදම් - අධ්‍යන පර්යේෂණ හා ප්‍රකාශන		17,325.00
ඉදිරියට රැගෙන ගියා	1,189,965,776.28	945,367,873.22

ඉදිරියට ගෙන ආවා	1,189,965,776.28	945,367,873.22
185 උපචිත වියදම් - I.D.R.C. ව්‍යාපෘතිය (GWCSRSA)		522.258.07
186 උපචිත වියදම් - I.D.R.C. ව්‍යාපෘතිය		-
187 උපචිත වියදම් - අවලංගු කල චෙක්පත්		10.480.00
188 උපචිත වියදම් - පාරිතෝෂික ගෙවීම්		-
189 උපචිත වියදම් - නිවාඩු ගමන් බලපත්		5,600.00
190 උපචිත වියදම් - තැපැල් වියදම්		400.00
191 සමුච්චිත ක්ෂය- ගොඩනැගිලි		50.464,357.28
192 සමුච්චිත ක්ෂය- කාර්යාලීය උපකරණ		1,946,722.53
193 සමුච්චිත ක්ෂය- රසායනාගාර සහ ඉගෙනුම් උපකරණ		7,197,053.42
194 සමුච්චිත ක්ෂය - උද්‍යාන අලංකරණ ව්‍යාපෘතිය		2,188,416.96
195 සමුච්චිත ක්ෂය - පුස්තකාල පොත		38,150,998.34
196 සමුච්චිත ක්ෂය - ලිඛිඩු සහ සවිකිරීම්		1,932,470.35
197 සමුච්චිත ක්ෂය- දුරකථන		112,000.00
198 සමුච්චිත ක්ෂය- මෝටර් රථ		6,040,000.00
199 සමුච්චිත ක්ෂය- පරිගණක හා මෘදුකාංග ගිණුම		16,761,409.96
200 සමුච්චිත ක්ෂය- ක්‍රීඩා උපකරණ		392,681.85
201 සමුච්චිත ක්ෂය- විදුලි ජනණ යන්ත සහ බල සැපයුම් පද්ධති		303,600.00
202 ස්ථාවර වත්කම් අගය මත රජයේ ප්‍රදාන ක්‍රමක්ෂය		480,331.27
203 වත්කම් ප්‍රත්‍යාගණනය අතිරික්ත මත ක්‍රමක්ෂය		7,099,252.83
204 ගෙවියයුතු රැඳවාගැනීම් ගිණුම		159,207.75
205 ණයහිමි ගිණුම -ඇල්ෆා කර්මාන්ත පුද්ගලික සමාගම		-
206 ණයහිමි ගිණුම - ඉන්ජිනේරු සැලසුම් මධස්ථානය		100,000.00
207 ණයහිමි ගිණුම - කේ.ටී. කාර්යාල ස්වයංක්‍රියකරණය පුද්ගලික සමාගම		-
208 ණයහිමි ගිණුම - බෙස් ව්පි පුද්ගලික සමාගම		-
209 ණයහිමි ගිණුම - විද්‍යාත්මක උපකරණය පුද්ගලික සමාගම		-
210 ණයහිමි ගිණුම - පර්යේෂණ උපකරණය පුද්ගලික සමාගම		-
211 ණයහිමි ගිණුම - එම්. ඩී. ගුණසේණ සහ සමාගම		-
212 ණයහිමි ගිණුම - සරසවි පොත්හල පුද්ගලික සමාගම		-
213 ණයහිමි ගිණුම - පවර්නෙට් පුද්ගලික සමාගම		-
214 ණයහිමි ගිණුම - සීතා ආයෝජන පුද්ගලික සමාගම		193,140.00
215 ගෙවියයුතු සේවානියුක්තයන්ගේ භාර අරමුදල		(111,189.73)
216 වත්කම් ප්‍රත්‍යාගණනය මත අතිරික්ත ගිණුම		22,162,520.82
217 විලම්බිත ලියාපදිංචි සහ අනෙකුත් ගාස්තු ආදායම		12,800.00
218 විලම්බිත පාඨමාලා ගාස්තු ආදායම		4,450,766.67
219 විලම්බිත පරීපාලන ගාස්තු ආදායම		16,300.00
220 විදේශ ශිෂ්‍ය ගෙවීම්		1,634.40
221 වැටුප් හා වේතන පාලන ගිණුම්	-	-
222 වැටුප් හා වේතන	25,673,534.85	
223 අනෙකුත් දීමනා	-	
224 අතිරේක දීමනා	4,244,159.12	
225 පර්යේෂණදීමනා (අධ්‍යයන) ගිණුම	1,614,907.62	
226 පොත්පත් (අධ්‍යයන) දීමනා	3,809,223.00	
227 විශේෂ දීමනා 15% ගිණුම	2,813,840.76	
228 ජීවනවියදම් දීමනා ගිණුම	4,389,591.66	
229 විශ්වවිද්‍යාල අර්ථසාදක අරමුදල	4,017,781.49	
230 සේවානියුක්තයන්ගේ භාර අරමුදල	1,268,025.50	
ඉදිරියට රැගෙන ගියා	1,237,796,840.28	1,105,961,085.99

ඉදිරියට ගෙන ආවා	1,237,796,840.28	1,105,961,085.99
231 විශ්වවිද්‍යාල විශ්‍රාමවැටුප් අරමුදල	2,322,354.94	
232 සංග්‍රහ දීමනා ගිණුම	219,528.00	
233 MC දීමනාව	8,395,243.01	
234 ඉන්ධන දීමනාව	617,845.00	
235 වැඩබැලීමේ දීමනාව	-	
236 පාරිතෝෂික	2,784,300.63	
237 ගැලපුම් දීමනාව	-	
238 සන්නිවේදන දීමනාව	112,935.48	
239 ප්‍රදාන සහ වන්දි ගිණුම	10,750.00	
240 මුද්දර ගාස්තු	14,200.00	
241 වැටුප් අත්තිකාරම්	-	
242 අතිකාල ගිණුම	3,377,561.32	
243 නිවාඩුදින ගෙවීම්	119,796.05	
244 පැ. පර්යේෂණ සහ ශිෂ්‍යත්ව ගිණුම	-	
245 සැපයුම් සහ අවශ්‍යතා- ලිපිද්‍රව්‍ය සහ කාර්යාලීය අවශ්‍යතා	1,510,413.64	
246 සැපයුම් සහ අවශ්‍යතා- ඉන්ධන සහ ලිහිසිද්‍රව්‍ය	1,088,022.55	
247 සැපයුම් සහ අවශ්‍යතා- රසායන ද්‍රව්‍ය සහ විදුරුභාණ්ඩ	7,600.00	
248 සැපයුම් සහ අවශ්‍යතා- නිලඇඳුම් සහ මැහුම් ගාස්තු ගිණුම	73,425.00	
249 සැපයුම් සහ අවශ්‍යතා- කාර්මික සහ විදුලි භාණ්ඩ	-	
250 සැපයුම් සහ අවශ්‍යතා- වෛද්‍ය	-	
251 සැපයුම් සහ අවශ්‍යතා- වෙනත්	339,181.92	
252 උපකරණ සුළු අලුත්වැඩියා සහ නඩත්තු	720,064.73	
253 වාහන සුළු අලුත්වැඩියා සහ නඩත්තු	723,858.33	
254 ගොඩනැගිලි සහ ජාකෘති සුළු අලුත්වැඩියා සහ නඩත්තු	576,190.50	
255 ගෘහභාණ්ඩ සුළු අලුත්වැඩියා සහ නඩත්තු	-	
256 අනෙකුත් සුළු අලුත්වැඩියා සහ නඩත්තු	-	
257 ප්‍රවාහන ගාස්තු	-	
258 සන්නිවේදන වියදම් ගිණුම	3,117,751.39	
259 විදුලි ගාස්තු	2,223,837.63	
260 මුද්‍රණ සහ දැන්වීම්	731,792.50	
261 විශේෂ සේවා කළමනාකරණ	2,572,802.53	
262 විභාග ගාස්තු	2,929,619.64	
263 සංග්‍රහ වියදම්	241,769.00	
264 ආරක්ෂක ගාස්තු	539,334.19	
265 නිවාඩු දින අවසරපත්‍ර	80,600.00	
266 අධ්‍යයන පර්යේෂණ සහ ප්‍රකාශන	170,834.40	
267 කාර්යමණ්ඩල සංවර්ධනය	-	
268 බැංකු ගාස්තු	95,050.14	
269 භාහිර කථිකාචාර්ය ගාස්තු	13,132,243.40	
270 ගමන් වියදම්(දේශීය)	18,161.00	
271 ගමන් වියදම්(විදේශීය)	-	
272 අනෙකුත් කොන්ත්‍රාත් සේවා	14,440.00	
273 විශේෂ සේවා වෘත්තීයය හ අනෙකුත් කටයුතු	862,036.47	
274 වෙනත් පුනරාවර්තන වියදම් ගිණුම	6,923.64	
275 පිරිසිදුකිරීමේ ගාස්තු ගිණුම	2,125,444.45	
ඉදිරියට රැගෙන ගියා	1,289,672,751.76	1,105,961,085.99

ඉදිරියට ගෙන ආවා	1,289,672,751.76	1,105,961,085.99
276 පලගායිතු ගිණුම	246,774.50	
277 විශ්වවිද්‍යාල ආචාර්යවරුන් සඳහා ගමන් වියදම් ප්‍රදාන	29,856.00	
278 තැපැල් ගාස්තු	177,869.99	
279 කුලී සහ බදුගාස්තු ගිණුම	-	
280 විරිපනම් සහ බදු වියදම් ගිණුම	-	
281 වැඩමුලු සහ සම්මන්ත්‍රණ ගිණුම	-	
282 සේවක සුබසාධන සහ වෛද්‍ය ආධාර	229,580.65	
283 ක්‍රීඩා කටයුතු ගිණුම	-	
284 සංයුක්ත සැලසුම්	-	
285 පාඨමාලා හැදින්වීම් මූලික වියදම්	-	
286 මූල්‍ය වියදම්	-	
287 ප්‍රායෝගික ගාස්තු වියදම්	112,005.50	
288 දේපළ ණය මත පොළී සහන	57,419.37	
289 අනෙකුත් ප්‍රාග්ධන වියදම්-පුණරාවර්තන ස්වරූපයේ	3,530,932.79	
290 ශිෂ්‍ය සුබසාධන, ශිෂ්‍ය සභා සහ සමාජ සහජීවනය	-	
291 උපාධි ප්‍රධානොත්සව වියදම් ගිණුම	-	
292 කොළඹ ශාඛාවේ වියදම් ගිණුම	3,194,610.19	
293 දායකත්ව සහ සාමාජික ගාස්තු	3,000.00	
294 ක්ෂේත්‍ර චාරිකා වියදම් ගිණුම	-	
295 වෙනත් සංවිධානයකට ප්‍රදාන	-	
296 විගණන ගාස්තු වියදම් ගිණුම	600,000.00	
297 වත්කම් බැහැර කිරීමේ ගිණුම	-	
298 රජයේ ප්‍රදාන පුණරාවර්තන වියදම්		-
299 රජයේ ප්‍රදාන ප්‍රාග්ධන වියදම්		-
300 රජයේ ප්‍රදාන පුනරුත්ථාපන වියදම්		-
301 ආයෝජනවලින් ලද පොළිය		138,941,295.54
302 ණය සහ අත්තිකාරම්වලින් ලද පොළිය		220,736.79
303 පාඨමාලා ගාස්තු ආදායම්		53,213,416.67
304 සමාසික ගාස්තු ආදායම්		2,458,200.00
305 පරිපාලන ගාස්තු (පශ්චාත් උපාධි)		5,103,800.00
306 විභාග ගාස්තු		2,023,400.00
307 විවිධ ලැබීම්		1,217,810.95
308 ප්‍රකාශන විකිනීම		1,860,580.00
309 පුස්තකාල දඩමුදල්		7,900.00
310 භාහිර පාර්ෂව සඳහා සේවා සැපයීම		797,345.09
311 අනෙකුත් ලැබීම්		-
312 වාර්ෂික සමුලු ආදායම		1,247,314.00
313 වැඩමුලු සහ සම්මන්ත්‍රණ		-
314 දේපළවලින් ලද කුලී		907,580.51
315 පුස්තකාල දායකත්වය		-
316 අරමුදල් මාරුකිරීම		-
317 පැරණි ගබඩාභාණ්ඩ විකිණීමේ ගිණුම		-
318 නිෂ්පාදන විකිණීමේ ගිණුම		-
319 වැඩමුලු සහ ව්‍යාපෘති වලින් ආයතනයේ දායකත්වය		845,333.13
320 නැතිවූ පුස්තකාල පොත් ගිණුම		-
321 කොළඹ ශාඛාවේ ආදායම් ගිණුම		9,815,550.00
ඉදිරියට රැගෙන ගියා	1,297,854,800.75	1,324,621,348.67

ඉදිරියට ගෙන ආවා	1,297,854,800.75	1,324,621,348.67
322 ක්ෂයකිරීම් - ගොඩනැගිලි	6,188,903.57	
323 ක්ෂයකිරීම්- කාර්යාලිය උපකරණ	988,053.58	
324 ක්ෂයකිරීම්- පුස්තකාල පොත්	153,130.65	
325 ක්ෂයකිරීම් - ගෘහභාණ්ඩ සහ සවිකිරීම්	974,891.43	
326 ක්ෂයකිරීම් - පරීක්ෂණාගාර සහ ඉංජිනේරු උපකරණ	4,686,466.24	
327 ක්ෂයකිරීම් - උද්‍යාන අලංකරණ ව්‍යාපෘතිය	360,057.55	
328 ක්ෂයකිරීම් - මෝටර් රථ	3,020,000.00	
329 ක්ෂයකිරීම්- දුරකතන පද්ධති	56,000.00	
330 ක්ෂයකිරීම් - පරිගණක හා මෘදුකාංග	8,905,294.03	
331 රඳවාගත් ඉපයුම් ගිණුම		(1,085,381.52)
332 ක්ෂයකිරීම් - ක්‍රීඩා උපකරණ	196,569.35	
333 ක්ෂයකිරීම් - විදුලි ජනණ යන්ත්‍ර සහ බල සැපයුම් පද්ධති	151,800.00	
එකතුව	**1,323,535,967.15**	**1,323,535,967.15**

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

3164

මගේ අංකය
எனது இல.
My No. CPCG/KD/D/PGIA/2024/01

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2024

B
DIA
AAG/PGIA

PGIA/DN.
Registrar
FMA
PGIA

OFFICE OF THE VICE-CHANCELLOR
77
16 JUL 2024
UNIVERSITY OF PERADENIYA

අධ්‍යක්ෂ,
කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය.

Acting Registrar
University of Peradeniya

Vice - Chancellor
University of Peradeniya
Peradeniya - Sri Lanka

1647

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

සහතික කරන ලද ගිණුම් සහ යටෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.එම්.පී.ඒ.පොන්සේකා
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත් :-
1. ලේකම් - අධ්‍යාපන අමාත්‍යාංශය
2. ලේකම් - මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
3. සභාපති - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
4. උපකුලපති - පේරාදෙණිය විශ්වවිද්‍යාලය

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. සිපිසිජී/කේඩී/ඩී/පිජීඅයිඒ/2024/01

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2024 මැයි 10 දින.

අධ්‍යක්ෂ

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, නිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාල තොරතුරු ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන් ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.3 ආයතනයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබාදීමට බලාපොරොත්තු වන කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබාගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

ආයතනයේ 2023 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සම්මතයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම

චිරම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන නඟුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි නති හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම් මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම් හා තක්සේරු කිරීම් සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීම්වලින් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය වීකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන් පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණයන් හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති/ විධානයට යොමුව	නිරීක්ෂණ
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
මුදල් රෙගුලාසි 756	ආයතනයට අයත් පුස්තකාලයේ 2021 වර්ෂයේ සිට වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදු කර නොතිබුණි.
(ආ) 1971 අංක 38 දරන මුදල් පනත	
11 වන වගන්තිය	ආයතනයේ සියලුම අතිරික්ත මුදල්, මුදල් අමාත්‍යාවරයාගේ පූර්ව අනුමැතිය මත ආයෝජනය කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළ රු.80,000,000 ක අතිරික්ත මුදලක් අමාත්‍යාවරයාගේ පූර්ව අනුමැතියකින් තොරව ආයෝජනය කර තිබුණි.
(ඇ) 2021 නොවැම්බර් 16 දිනැති අංක PE/01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර	මුදල් වර්ෂය අවසන් වී මාස 05 ක් ඇතුළත ආයතනයේ විගණන වාර්තාව සමඟ ඉකුත්

චක්‍රලේඛයේ 3.2 ඡේදය	ඒ වර්ෂයේ කාර්යසාධනය ඇතුළත් වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවද, ඉකුත් වර්ෂයේ වාර්ෂික වාර්තාව සමාලෝචිත වර්ෂය අවසාන දින දක්වා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි
(ඇ) 2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 9.12 ඡේදය	රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තුමේන්තුවේ හා මහා භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව 2020 අගෝස්තු සිට 2023 දෙසැම්බර් දක්වා කාලය තුළ සේවක අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා රු.717,000 ක මුදලක් ආයතනයේ දායකය වශයෙන් , ජාතික රක්ෂණ භාර අරමුදල වෙත ගෙවා තිබුණි.
(ඉ) 2023 මාර්තු 29 දිනැති අංක SEC/2023/E/01 දරන දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවේ අත්තිකාරම් පුද්ගල ආදායම් බදු (APIT) මාර්ගෝපදේශ සංග්‍රහය	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් සහ බාහිර දේශකවරු 114 දෙනෙකු වෙනුවෙන් 2023 අප්‍රේල් 01 සිට 2023 දෙසැම්බර් 31දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළව දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු අත්තිකාරම් පුද්ගල ආදායම් බදු මුදල රු.5,199,310 ක් වුවද, සාවද්‍ය ලෙස ගණනය කර රු.573,323 ක් පමණක් ගෙවා තිබීම හේතුවෙන් දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත රු.4,625,987 ක බදු මුදලක් අඩුවෙන් ගෙවා තිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට යොමුව	නිරීක්ෂණ
(උ) 2016 මාර්තු 01 දිනැති අංක 04/2016 දරන විශ්වවිද්‍යාලය ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය 5.2.1 ඡේදය	ස්වයං මූල්‍ය උත්පාදන ක්‍රියාකාරකම්වල මුළු වක්‍ර පිරිවැයෙන් සියයට 15 සිට සියයට 30 දක්වා ප්‍රමාණයක් විශ්වවිද්‍යාලයේ සංවර්ධන වැය විෂය සඳහා වෙන් කළයුතු වුවද, 2022/2023 අධ්‍යයන වර්ෂය සඳහා පිළියෙල කරන ලද අයවැය ලේඛනවලින් අධ්‍යයන මණ්ඩල 11 කට අදාළව රු.59,035,458 ක් වෙන් කර නොතිබුණි.

(ආ)	2018 මැයි 18 දිනැති අංක UGC/L/2020 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ලිපිය	සියලුම ‘පශ්චාත් උපාධි ආයතනවල කළමනාකරණ මණ්ඩලයේ සම්පූර්ණ සාමාජිකත්වය උපරිමය සාමාජිකයින් 11 දෙනෙකුට සීමා කළ යුතු බව දක්වා තිබුණද, ඒ අනුව නටයුතු නොකර සාමාජිකයින් 35 දෙනෙකුගෙන් සමන්විත කළමනාකරණ මණ්ඩලයක් පත් කර තිබුණි. මේ හේතුවෙන් 2019 වර්ෂයේ සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා කාලපරිච්ඡේදය තුළ කළමනාකරණ මණ්ඩලයේ රැස්වීම් වාර 37 ක් සඳහා අනිරික්ත සාමාජිකයින් වෙනුවෙන් සහනාගීත්ව දීමනා ලෙස එකතුව රු.2,164,263ක අමතර වියදමක් දැරීමට සිදුවී තිබුණි.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීති, රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 වෙනත් කරුණු

(අ) ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීමේදී මූල්‍ය ආයතන මඟින් පොලී අනුපාත පිළිබඳව මීල ගණන් කැඳවීමකින් තොරව හා වෙළඳපල පොලී අනුපාතයන් හි විචලනයන් පිළිබඳ විවක්ෂණශීලීව කටයුතු කිරීමකින් තොරව එකම බැංකුවක ස්වයංක්‍රියව යාවත්කාලීන කිරීම හේතුවෙන් 2022/2023 වර්ෂය තුළ ආයතනයට උපයාගත හැකිව තිබුණු රු.38,362,216 ක පමණ පොලී ආදායමක් අහිමි වී තිබුණි.

(ආ) ආයතනයේ සංචාරක නිවාඩු නිකේතනයෙන් අය කරනු ලබන ගාස්තු 2014 වර්ෂයේ සිට වියදමට සාපේක්ෂව සංශෝධනය නොකිරීම හේතුවෙන් පසුගිය වසර 05 ක කාලය තුළ උපයන ලද රු.1,816,495 ක ආදායම ඉක්මවා රු.6,464,284 ක වියදම් දැරීමට සිදුව තිබුණි.

(ඇ) ගිණුම්කරණ පරිගණක පද්ධතියක් ස්ථාපිත කිරීම වෙනුවෙන් පෞද්ගලික ආයතනයක් සමඟ 2017 අගෝස්තු 14 දින රු.2,100,000 කට ගිවිසුම්ගතවී අත්තිකාරම් වශයෙන් රු.1,050,000 ක් ගෙවා තිබුණද, ගිවිසුම්ගත කාල පරිච්ඡේදය අවසන් වී වසර 06 කට වැඩි කාලයක් ගතවී තිබුණද පරිගණක පද්ධතිය ස්ථාපිත කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

	නිරීක්ෂණ		කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම
2.2.2	නිතිරීති හා විධාන වලට අනුකූල නොවීම		
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 756	ආයතනයට අයත් පුස්තකාලයේ 2021,වර්ෂයේ සිට වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදු කර නොතිබුණි	2021 වර්ෂයට අදාළ තොග සමීක්ෂණ කටයුතු 2023 වර්ෂයේ ඔක්තෝබර් මාසය ඇතුලත අවසන් කිරීමට කටයුතු කරන ලද අතර එයට අදාල තොග සමීක්ෂණ වාර්තාව කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පුස්තකාලය වෙත මෙතෙක් ලැබී නැත. පිළිවලින් 2022 හා 2023 වර්ෂ සඳහා තොග සමීක්ෂණ කාර්යන් ආරම්භ කිරීමට 2021 වර්ෂයට අදාල වර්තාව ආයතනය වෙත ලැබිය යුතු බැවින් අදාළ නිළදාරීන් දැනුවත් කර එම වාර්තාව ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. එම වාර්තාව ලද විගස එය විගණන අංශය වෙත යොමුකර 2022, 2023 වර්ෂ වලට අදාළ තොග සමීක්ෂණ කාර්යයන් 2024 වර්ෂයේදී අවසන් කිරීමට පියවර ගනු ලැබේ.
(ආ)	1971 අංක 38 දරණ මුදල් පනත 11 වනි වගන්තිය	ආයතනයේ සියලුම අතිරික්ත මුදල්, මුදල් අමාත්‍යවරාගේ පූර්ව අනුමැතිය මත ආයෝජනය කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළ රු.80,000,000.00 ක අතිරික්ත මුදලක් අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතියකින් තොරව ආයෝජනය කර තිබුණි.	1971 අංක 38 දරණ මුදල් පනතේ 11 වගන්තිය හා 2003 ජූනි 02 දිනැති අංක PED /12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 8.2.2 ඡේදයට අනුකූලව 2023 වර්ෂයේ දෙසැම්බර් 30 ට පවතින අතිරික්ත මුදල් රුපියල් මිලියන 60 ක ප්‍රමාණයක් ස්ථාවර තැන්පතුවක ආයෝජනය කිරීමට මුදල් ඇමතිවරයාගේ පූර්ව අනුමැතිය ලබාගැනීම පිණිස සභාපති, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය හරහා මුදල් අමත්‍යාංශයේ ලේකම් වෙත 2023.12.01 දිනැති ලිපිය ඉදිරිපත් කළෙමු. මේ සඳහා කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ කළමණාකරණ මණ්ඩල නිර්දේශය 2023.12.01 දින පැවති 274 වැනි රැස්වීමේදී ලබා ගන්නා ලදී. නමුත් දෙසැම්බර් 29 වන තුරුත් ඒ සඳහා අනුමැතිය නොලද අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අභ්‍යන්තර විගණන චක්‍රලේඛ අංක 02/2019 හා 04/2011 යන චක්‍රලේඛයන්ට අනුකූලව රාජ්‍ය බැංකුවලින් මිල ගණන් කැඳවීමේ පටිපාටිය යටතේ ස්ථාවර තැන්පතු අනුපාතයන් කැඳවා ඉහළම පොලී අනුපාතයක් ඉදිරිපත් කළ මහජන බැංකුවෙහි රු 80,000,000.00 ක ස්ථාවර තැන්පතුවක් මාස 12 කාලයකට තැන්පත් කරන ලදී. මෙහිදී රුපියල් මිලියන 60 ක අනුමැතිය ඉල්ලුවද මිලියන 80 ක ස්ථාවර තැන්පතුවක් දැමීමට හැකියාවක් පැවති බැවින් එසේ අනුමැතින් සහිතව ආයෝජනය කර එයද මුදල් අමත්‍යවරයාගේ අනුමැතිය සඳහා යොමු කරන ලදි.

			මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගැනීම සඳහා මාස 03 කට වැඩි කාලයක් ගත වන නිසාත් මිල ප්‍රකාශනයක වලංගු කාලය දින 03 ක් පමණක් වන නිසාත් අනුමැතිය ලබාගැනීමෙන් පසු ආයෝජන කටයුතු වල නියැලීමේදී වර්ෂ අවසාන අතිරික්තය නියමිත දිනට ආයෝජනය කිරීමේ ප්‍රායෝගික දුෂ්කරතාවලට මුහුණ පෑමට සිදුවන බැවින් මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලැබෙන තුරු ආයතනයේ පාලක මණ්ඩල අනුමැතින් සහිතව ආයෝජනය කළෙමු. ඉන් අනතුරුව 27.02.2024 දාතමින් යුතුව අධ්‍යාපන අමත්‍යවරයාගේ නිර්දේශ ලිපිය අප වෙත ලැබුන අතර මුදල් අමත්‍යවරයාගේ අනුමැති ලිපිය මෙතෙක් නොලද්දෙමු.
(ඇ)	2021 නොවැම්බර් 16 දිනැති අංක PE/01/2021 දරණ රාජ්‍ය ව්‍යාපාර වක්‍රලේඛය 3.2 ඡේදය	ආයතනයේ කාර්යසාධනය ඇතුළත් වාර්ෂික වාර්තාව පර්ලිමේන්තුවේ සභාගත කල යුතු වුවද ඉකුත් වර්ෂයේ වාර්ෂික වාර්තාව සමාලෝචි වර්ෂය අවසාන දින දක්වා පාර්ලිමේන්තු නොතිබුණ බව නිරීක්ෂණය විය.	2022 වර්ෂයට අදාල වන වාර්ෂික වාර්ථාවේ කෙටුම් පත 2023/03/02 වන දින අධ්‍යාපන අමාත්‍යාංශයට බාරදීමට කටයුතු කර ඇත. ඒ අනුව කෙටුම්පත පරීක්ෂා කිරීමෙන් අනතුරුව අමාත්‍යාංශයේ දැනුම් දීමකට අනුව 2023.07.06 විගණන මතයද සඳහන් කරමින් වාර්ෂික වාර්ථාවේ පිටපත් 05 අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍යාංශයට ලබා දීමට කටයුතු කර ඇත. ඒ අනුව 2023.09.02 වන දි අමාත්‍ය මණ්ඩල සංදේශයද 2023.11.17 දින අමාත්‍ය මණ්ඩල තීරණයද ලැබී තිබුණි. ඒ අනුව 2024.02.11 දින අමාත්‍යාංශයෙන් ලැබුණු දැනුම් දීමකට ඒ අනුව පිලියෙල කරන ලද වාර්ෂික වාර්තාව අදාල ආයතන මඟින් ලබා දුන් දිනය වන 2024.03.04 දින පාර්ලිමේන්තු සභා ගත කිරීම සඳහා පාර්ලිමේන්තුවට භාරදීමට කටයුතු කර ඇත.
(ඇ)	2003 ජූනි 02 දිනැති අංක PED /12 දරණ රාජ්‍ය ව්‍යාපාර වක්‍රලේඛය	සේවක සුභ සාධක යෝජනා ක්‍රමයන් ක්‍රියාත්මක කිරීමේදී එය අදාළ වර්ෂයේ අයවැය ලේඛනයට ඇතුලත් කර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ හා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගත යුතු වුවද, එවැනි අනුමැතියකින් තොරව 2020 අගෝස්තු මස සිට 2023 දෙසැම්බර් දක්වා කාලය තුළ සේවක අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා රු.717,000.00 ක මුදලක්	අංක 15/2018 දරණ 26/11/2018 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාව නිකුත් කළ වක්‍රලේඛනයට අනුව යමින් කළමණාකරණ මණ්ඩල අනුමැතිය සහිතව සේවක අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා වන ආයතනයේ දායක මුදල 2022 වර්ෂයේ සංශෝධිත අයවැයට ඇතුලත් කර ඒ සඳහා අවශ්‍ය සියලු අනුමැතින් ලබා ඇති බැවින් එය නිත්‍යානුකූල ගෙවීමක් ලෙස සඳහන් කළ හැකිය.

		ආයතනයේ දායකය වශයෙන් ජාතික රක්ෂණ භාර අරමුදල වෙත ගෙවා තිබුණි	
(ඉ)	2023 මාර්තු 29 දිනැති අංක SEC/2023/E/01 දරණ දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවේ අත්තිකාරම් පුද්ගල ආදායම් බදු (APIT) මාර්ගෝපදේශ සංග්‍රහය	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් සහ බාහිර දේශකවරු 114 දෙදෙනෙකු වෙනුවෙන් 2023 අප්‍රේල් 01 සිට 2023 දෙසැම්බර් 31 දක්වාවූ කාලපරිච්ඡේදයට දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු අත්තිකාරම් පුද්ගල ආදායම් බදු මුදල (APTT) රු.5,199,310.00 ක මුදලක් වුවද, සාවද්‍ය ලෙස ගණනය කර රු. 573,323 ක් පමණක් ගෙවා තිබීම හේතුවෙන් ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත රු.4,625,987.00 ක බදු මුදලක් අඩුවෙන් ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය.	මෙම ආයතනයේ දැනට ඇතිවී ඇති තත්ත්වයට ප්‍රධාන හේතුව වූවේ මෙම ආදායම් බදු ක්‍රමය පිළිබඳ ඇති වූ ගැටළුවයි. මෙම ගැටළුකාරී තත්ත්වය දැනට කළමණාකරණ මණ්ඩලය මඟින් සමතයට පත් කර ඇති අතර ඒ අනුව බාහිර දේශකවරුන් හා ඔවුන් ගේ සේවය සහ ආයතනයේ අනාගතය සලකා බලා ඔවුන් ස්වාධීන සේවා සපයන්නන් (Independent service provider) ලෙස හඳුනා ගෙන පත්වීම් ලිපි ලබා දී ඇත. ඒ අනුව ස්වාධීන සේවා සපයන්නන් (Independent service provider) සේවා බාණ්ඩයට අදාළ වන 5% බදු ප්‍රතිශතය ඔවුන්ගෙන් අය කිරීමට කටයුතු කර ඇත.
2.2.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව		
(අ)	බලතල, කාර්තව්‍ය සහ කාර්යයන්ට යොමුව 2016 මාර්තු 01 දිනැති අංක 04/2016 දරණ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා වක්‍රලේඛය. 5.2.1 ඡේදය	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2016 මාර්තු 01 දිනැති අංක 04/2016 වක්‍රලේකය අනුව ස්වයං මූල්‍ය උත්පාදන ක්‍රියාකාරකම් සඳහා පිළියෙල කරන ලද අයවැය ලේඛන වක්‍ර පිරිවැය යටතේ 5.2.1 හා 5.2.2 ඡේද ප්‍රකාරව පිළිවෙලින් විශ්වවිද්‍යාල /උසස් අධ්‍යයන ආයත සංවර්ධන වැය විෂය සඳහා 15% සිට 30% දක්වා ප්‍රමාණයක්	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2016 මාර්තු 01 දිනැති අංක 04/2016 වක්‍රලේඛය අනුව ස්වයං මූල්‍ය උත්පාදන ක්‍රියාකරකම් සඳහා පිළියෙල කරන ලද අයවැය ලේඛන වක්‍ර පිරිවැය යටතේ 5.2.1 ප්‍රකාරව 15% - 30% දක්වා ප්‍රමාණයක් ආයතනයේ සංවර්ධන වැය විෂය යටතේ වෙන් කළ යුතු අතර 5.2.2 ප්‍රකාරව අධ්‍යක්ෂ සංවර්ධන වැය විෂය සඳහා 0% - 5% අතර ප්‍රමාණයක් වෙන් කළ හැකිය. මෙහිදී වක්‍රලේඛයට අනුව 5.1.5 ප්‍රකාරව විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතනික යටිතල පහසුකම් සංවර්ධන වැය ශීර්ෂය යටතේත් යම් ප්‍රතිශතයක් වෙන් කළ හැකිය. වක්‍රලේඛයට අනුව ඉහත වැය ශීර්ෂ සඳහා කුමන ප්‍රමාණයක් වෙන් කළද අවසානයේදී එම ප්‍රතිශතය මුළු ආදයමින් 20% - 35% අතර ප්‍රමාණයක් විය යුතුය. ඊට අනුකූලව, වක්‍රලේඛයේ සංවර්ධන වැය ශීර්ෂ යටතේ දක්වන 5.1.5, 5.2.1 සහ 5.2.2 යන ශීර්ෂ තුනට වෙන් කරන ලද ප්‍රමානය මුළු ආදයමින් 20% - 35% අතර පවත්වාගෙන ගොස් ඇත. ඒ

		හා උපකුලපති/අධ්‍යක්ෂ සංවර්ධන වැය විෂය (VC'S/Director Vote) සඳහා සියයට 0ත් 5ත් අතර ප්‍රමාණයක් වෙන් කළ යුතු බවට දක්වා ඇතත්, කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් 2022/2023 අධ්‍යයන වර්ෂයේ සඳහා පිළියෙල කරන ලද අයවැය ගත ආදායම රු. 59,035,458.00 ක් වූ අධ්‍යයන මණ්ඩල 11 කට අයත් අයවැය ලේඛනවලින් කිසිදු ප්‍රතිපාදනයක් ඉහත සඳහන් වැය විෂයන් සඳහා වෙන් කර නොතිබුණි.	අනුව මුළු අයවැය ගත ආදායම වන රු.59,035,458.00 ක් වූ මුදලින් 20% ක ප්‍රතිපාදනයක් සමස්ථ සංවර්ධන වැය ශීර්ෂයට වෙන් කර ඇත.
(ආ)	2018 මැයි 18 දිනැති අංක UGC/L/2020 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ලිපිය	සියලුම පශ්චාත් උපාධි ආයතනවල කළමණාකරණ මණ්ඩලයේ සම්පූර්ණ සාමාජිකත්වය උපරිමය සාමාජිකයින් 11 දෙනෙකුට සීමා කල යුතු බව දක්වා තිබුණද, ඒ අනුව කටයුතු නොකර සාමාජිකයින් 35 දෙනෙකුගෙන් සමන්විත කළමනාකරණ මණ්ඩලයක් පත් කර තිබුණි. මේ හේතුවෙන් 2019 වර්ෂයේ සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා කාලපරිච්ඡේදය තුළ කළමකරන මණ්ඩලයේ රැස්වීම් සඳහා සාමාජිකයින් 11 කට වඩා සහභාගි වීම වෙනුවෙන් රැස්වීම් වාර 37 ක් සඳහා එකතුව රු.2,164,263.00 ක අමතර වියදමක් දරා තිබුණි.	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද UGC/L/2020 අංක දරණ 2018 දිනැති ලිපිය කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පාලක මණ්ඩලය මඟින් එහි 237 වැනි කළමණාකරණ මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කර ඒ පිළිබඳ නිර්දේශ ලබා ගැනීම සඳහා එම මණ්ඩලයේ සියළුම සාමාජිකයින් නියෝජනය වන පරිදි කමිටුවක් පත් කරන ලද අතර එහිදි ලබා ගන්නා ලද නිර්දේශ 2018.09.21 වන දින පැවැති 238 වන කළමණාකරන මණ්ඩලයට ඉදිරිපත් කරන ලදි. එහිද සාමාජික සංඛ්‍යාව 21 දක්වා අඩු කිරීමට යෝජනා ඉදිරිපත් කර තිබූ අතර එය දළ වශයෙන් සමාජික සංඛ්‍යාවෙන් 42% ක අඩු කිරීමක් වේ. එම සාමාජිකයන් ප්‍රමාණය ආයතනයෙන් ප්‍රශස්ත ක්‍රියාකාරිත්වය පවත්වා ගැනීමට අවශ්‍ය වන අවම සාමාජික සංඛ්‍යාව ලෙස එහිදි දක්වා ඇති අතර මෙම වෙනස් වීම් වලට අදාළව ආයතනයේ නියාමාවලියෙහි (ordinance) සිදුවිය යුතු වෙනස්කම් ද එහි දක්වා ඇත. මෙම යෝජනාව පේරාදෙණිය විශ්වවිද්‍යාල පාලක සභාවේ අනුමැතිය සහිතව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම වෙත ඉදිරිපත් කල යුතු බැවින් 2018.10.27 වන දින පවත්වන ලද 480 වන පාලක සභාව වෙත ඉදිරිපත් කරන ලදී. ඒ අනුව 480 වන පාලක සභාව මඟින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව දැනුම් දුන් පරිදි පශ්චාත් උපාධි ආයතනවල ඇතිකල යුතු වෙනස්කම් සම්බන්ධයෙන් විෂය භාර අමාත්‍යතුමා සමඟ ඉදිරියේදී සාකච්ඡා කර ඒ අනුව තීරණයකට එළඹීය යුතු බව එහිදි තීරණය කරන ලදි. එහෙත් පවත්වන ලද සාකච්ඡාවල වලින් අනතුරුව

		තීරණයකට එළඹී නොමැති බැවින් කළමණාකරන මණ්ඩල තීරණය ක්‍රියාත්මක කිරීමට හැකියාවක් නොලැබුණි. තවද කළමණාකරන මණ්ඩලයේ සංයුතිය පිළබඳ විගණන විමසුම 2023.12.01 වන දින පැවැති 274 වන කළමණාකරන මණ්ඩලයේදී සාකච්ඡා විය. ඒ අනුව ඇතිවී ඇති නව ප්‍රවනතාවයන්ට අනුකූලව කළමණාකරන මණ්ඩලයේ සංයුතිය අනිවාර්යයෙන්ම අඩු විය යුතු බවට යෝජනා කරන ලද අතර නිවැරදි සංයුතිය කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ නියමාවලිය අධ්‍යයන කිරීමෙන් අනතුරුව සිදු කල යුතු බවට තීරණය විය. ඒ අනුව මේ සම්බන්ධයෙන් ඉදිරියේදී අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව දන්වා සිටිමි. එසේ සිදු කරන නිර්දේශ පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය පාලක සභාවේ හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතියට ඉදිරිපත් කිරීමට කටයුතු සිදු කරන බව දන්වා සිටිමි. නව නියමාවලියක් අනුමත වන තෙක් පවතින නියමාවලියට (ordinance) අනුකූලව විගණන විමසුමේ දක්වා ඇති සියලු වියදම් දරා ඇති බව දන්වා සිටිමි.
2.3	**වෙනත් කරුණු**	
(අ)	ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීමේදී මූල්‍ය ආයතන මඟින් පොලිඅනුපාත පිළිබඳව මිල ගණන් කැඳවීමකින් තොරව හා වෙළඳපල පොලි අනුපාතයන් හි විචලයන් පිළිබඳව විචක්ෂණශීලීව කටයුතු කිරීමකින් තොරව එකී බැංකුවේම ස්වයංක්‍රීයව යාවත්කාලීන කිරීම හේතුවෙන් 2022/2023 වර්ෂය තුළ ආයතනයට උපයාගත හැකිව තිබුණු රු.38,362,216.00 ක පමණ පොලී ආදායමක් අහිමි වී තිබුණි.	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අංක 04/2019 හා 2019 ජූලි 29 දිනැති අභ්‍යන්තර විගණන චක්‍රලේඛ ලිපියේ 1 ඡේදය ප්‍රකාරව නව ආයෝජනයකදී මූල්‍ය කමිටු නිර්දේශ, කළමණාකරණ මණ්ඩල අනුමත කිරීම් සහිතව 1971 අංක 38 මුදල් පනතේ 11 වැන වගන්තිය හා 2003.06.02 දිනැති PED 12 රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛයේ 8.2.2 වගන්තිය ප්‍රකාරව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ අධ්‍යාපන අමාත්‍යාංශ හරහා මුදල් අමාත්‍යාංශය වෙත ලිඛිත ඉල්ලීමක් යොමු කළ යුතුව ඇත. එමෙන්ම කල්පිරුණ ආයෝජන නැවත ආයෝජය කිරීමේදීත් එම තැන්පතු පවත්වාගෙන යන බැංකුවේම ස්වයංක්‍රියව යාවත්කාලීන කිරීමක් නොකර මිල කැඳවුම් ලබාගෙන අධ්‍යක්ෂක, නියෝජ්‍ය ලේඛකාධිකාරි සහ ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරි යන පරිපාලන නිලධාරීන් ගෙන් සමන්විත මණ්ඩලය විසින් විවෘත කර ඉහලම පොලි අනුපාතයක් ලබාදෙන රාජ්‍ය බැංකුවෙහි ආයොජනය කර එම සියළු විස්තර මූල්‍ය කමිටු අනුමැතියට යොමු කිරීමට කටයුතු කරනු ලැබේ.මුදල් කමිටුව මාස දෙකකට වරක් රැස්වෙන බැවින් දින 03 ක් පමණ වලංගු වන මිල කැඳවුමක් එතෙක් වලංගු නොවන බැවින් අධ්‍යක්ෂතුමාගෙ අනුමැතිය යටතේ ආයෝජනය කරනු ලැබේ. මෙහිදී බැංකු කිහිපයක් එකම පොලි අනුපාතයක් ඉදිරිපත් කර ඇති විටෙක බැංකු කළමණාකාරිත්වය සමඟ සාකච්ඡා කර ඉහළ

		අනුපාතයක් සහතික කරන බැංකුව වෙත තැනපතු ආයෝජනය කරන්නෙමු. 2016 ට පෙර කරන ලද යම් ස්ථාවර තැන්පතු ස්වයංක්‍රීය යාවත්කාලීන කිරීමට තැන්පත් කර ඇති අතර එම තැන්පතු කිහිපයක් එම බැංකුවේම ස්වයංක්‍රීයව යාවත්කාලීන වී ඇත. වර්තමානයේදී ස්ථාවර තැන්පතු වල ස්වයංක්‍රිය යාවත්කාලීන කිරීම ඉවත් කරන ලදී. අදාල ලිපි ලේඛන ගොනු ගත කර ඇති අතර විගණන පරීක්ෂාවට ලක් කළ හැකිය. ස්ථාවර තැන්පතු සඳහා වූ පොලි ප්‍රතිශතයේ ඉහළ යාම 2022 වර්ෂයේ අප්‍රෙල් මස අග භාගයේ පටන් ඇරඹී ක්‍රමයෙන් වැඩිවී ගොස් ජූලි - සැප්තැම්බර් වන විට උච්චස්ථාන ගතව ක්‍රමයෙන් පහළ බැසිමට ලක්වුනි. ඒ අනුව 2022 වර්ෂයේ ජනවාරි පෙබරවාරි, මාර්තු මාස වල නැවත ආයෝජනයන් අඩු පොලි අනුපාතයන් යටතේ ඉදිරියට ආ අතර 2022 මැයි මාස අග භාගයේදි පැවති කළමණාකරන මණ්ඩල තීරණය මත ආයෝජන කමිටුවක් පත් කරන ලදි. එහිදි රැස්වූ කමිටු සාමාජිකයින් අඩු අවදානමක් පවතින ස්ථාවර තැන්පතු වල ආයෝජනය දිරිමත් කරන ලද අතර මීල කැඳවුම් ක්‍රමය අනුගමනය කර පසුව බැංකු කළමණාකාරිත්වය හා සාකච්ඡා කොට ඉහළ පොලි අනුපාතයක් ලබා ගැනිමට කටයුතු කරන ලෙස දන්වන ලදි. ඊට අනුකූල වෙමින් අනුමැතිය ලබා දුන් දින සිට ඉහළම පොලි අනුපාතයකට කල් පිරුණු ආයෝජන නැවත ආයෝජනය කරන ලද අතර එම ක්‍රියාවලිය සඳහා මූල්‍ය කමිටු සහ කළමණාකරණ මණ්ඩල අනුමැතිය ලබා ගැනිමට කටයුතු කරන ලදි. ඊට අනුකූල වෙමින් අනුමැතිය ලබා දුන් සිටම ඉහළම පොලි අනුපාතයකට කල්පිරුණු තැන්පතු ආයෝජනය කිරීමට කටයුතු කර ඇත්තේ මූල්‍ය කමිටු හා කළමණාකරණ මණ්ඩල අනුමැතිය සහිතවය.
(ආ)	ආයතනයේ සංචාරක නිවාඩු නිකේතනයෙන් අය කරනු ලබන ගාස්තු 2014 වර්ෂයේ සිට වියදමට සාපේක්ෂව ප්‍රමාණාත්මකව සංශෝධනය නොකිරීම හේතුවෙන් පසුගිය වසර 05 කාලය තුළ උපයන ලද රු.1,816,495.00 ක ආදායම ඉක්මවා රු.6,464,284.00 ක් වියදම් කර තිබුණි	සංචාරක නිකේතනයේ මෙහෙයුම් වියදම පෙර වර්ෂ වලට වඩා ඉහළ යාමට 2022/2023 වර්ෂයේ විදුලි බිල්පත් ගාස්තු රජය විසින් ඉතා වැඩි ප්‍රතිශතයකින් ඉහළ නැංවීම සේම පේරාදෙණි විශ්වවිද්‍යාලීය නිල නිවාස වලින් ජල ඒකකයක් වෙනුවෙන් අයකරන ලද සහනදායි අයකිරීම ජල සම්පාදන මණ්ඩලය මඟින් ඉවත් කිරීම යන කරුණු බෙහෙවින්ම බලපාන ලදි. එසේම සංචාරක නිකේතන නිවාසය භාරකරු වේතනය ස්ථාවර මෙහෙයුම් වියදමක් වේ. තවද විගණන විමසුමේ දක්වා ඇති ලී බඩු උපකරණ 2023 වසරේ අලුතින් පද්ධතියට එක් කරන ලද සංචාරක නීකේතනය සඳහා දරණ ලද ප්‍රාග්ධන වියදම් වන අතර එහි අදායම් ලැබීම ආරම්භ වන්නේ 2024 වර්ෂයේ සිටය.

		රටේ පැවති ඉහළ උද්දමන තත්ත්වය මත ශිෂ්‍රයෙන් ඉහල යන ලද මෙහෙයුම් වියදම සැලකිල්ලට ගනිමින් ආයතනය සතු සංචාරක නිවාසයෙන් උපරිම ආදායමක් ලබාගැනීමේ අරමුණින් 2023 අගෝස්තු 15 සිට කළමණාකරණ මණ්ඩල අනුමැතිය සහිතව නිකේතන වෙන් කර ගන්නා අමුත්තන්ගෙන් අය කෙරෙන ගාස්තුව පහතින් දැක්වෙන පරිදි ඉහළ නැංවීමට ආයතනයේ පාලන මණ්ඩලය කටයුතු කරන ලදි. **දේශීය අමුත්තන්** තනි කාමර 1,250.00 → 2,500.00 (100%) ද්විත්ව කාමර 1,500.00 → 3,000.00 (100%) **විදේශ අමුත්තන්** තනි කාමර 3,500.00 → 4,000.00 (14%) ද්විත්ව කාමර 4000.00 → 5,000.00 (25%) **නිල කටයුතු සඳහා PGIA වෙත පැමිණෙන අමුත්තන්** තනි කාමර 500.00 → 600.00 (20%) ද්විත්ව කාමර 750.00 → 900.00 (20%) ඉහත දක්වා ඇති පරිදි දේශීය අමුත්තතන් වෙනුවෙන් අය කෙරෙන ගාස්තු 100% ඉහල නංවා ඇති අතර අනෙකුත් අමුත්තන් වෙනුවෙන් අය කෙරෙන ගාස්තු ද සැලකිය යුතු ප්‍රතිශතයකින් වැඩිකිරීමට කටයුතු කර ඇත. තවදුරටත් එයින් ලැබෙන ආදායම වැඩිකර ගත හැකි මාර්ග සොයා බලන අතර විශ්වවිද්‍යාලීය නොවන අමුත්තන් සඳහා නවාතැන් පහසුකම් සැපයීමේ ඉඩ ප්‍රස්ථා ඇතිදැයි සොයා බලනු ලැබේ.
(ඇ)	ගිණුම්කරණ පරිගණක පද්ධතියක් ස්ථාපිත කිරීම වෙනුවෙන් පෞද්ගලික ආයතනයක් සමඟ 2017 අගෝස්තු 14 දින රු.2,100,000.00 කට ගිවිසුම්ගතවී අත්තිකාරම් වශයෙන් රු.1,050,000.00 ක් ගෙවා තිබුණද, ගිවිසුම්ගත කාල පරිච්ඡේදය අවසන් වී වසර 06 කට වැඩි කාලයක් ගත වී තිබුණද පරිගණක පද්ධතිය ස්ථාපිත කර නොතිබුණි.	ගිවිසුමට අනුව 2018 අගෝස්තු මස වන විට ස්ථාපිත කල යුතු වුවද 2019 වර්ෂයේ පැවති විශ්වවිද්‍යාල වැඩවර්ජනය, පාස්කු ප්‍රහාරය, 2020 -2021 වර්ෂවල පැවති කොරෝනා වසංගතය ආදී කරුණු මූලික කොටගෙන පරිගණක පද්ධතිය නිසි අයුරින් ස්ථාපිත කර ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. 2022 වර්ෂයේ පටන් පද්ධතියට දත්ත ඇතුලත් කිරීම ඇරඹුවද ප්‍රකමාණකරු(Programmer) විවිධ ගැටළු මත ඉදිරියට යාමට නොහැකි විය. එකක් නිවැරදි කරන විට තව තැනක ගැටළු පැන නැගුණි. 2022 හා 2023 වර්ෂ වලදි Science land IT (Pvt) Ltd ආයතනය සමඟ රැස්වීම් ගණනාවක් රජයේ හා අභයන්තර විගණන අංශ දෙකේ ද සහභාගිත්වයෙන් යුතුව පවත්වන ලදි. මෙහිදි ආයතනයේ

		ගිණුම් අංශයේ අවශ්‍යතාවයන්ට අනුකූලව වාර්තා හා අවසන් ගිනුම් ලබා දීමට Science land IT (Pvt) Ltd ආයතනය එකඟ වූ නමුත් මේ වන විටත් නිවැරදිව අවසන් වාර්තා ලබාගැනීමේ ගැටළු නිරාකරණය කරමින් පවති. ඒ අනුව පද්ධතියේ දැනට අවසන් කර ඇති ප්‍රමාණයන් පහත සඳහන් පරිදි දැක්විය හැකිය. ස්ථාවර වත්කම් රෙජිස්ටර් මොඩියුලය (Fixed Assets Register Module) — 95% (වත්කම් ප්‍රත්‍යාගණන පරීක්ෂාවට යටත්ව) වැටුප් මොඩියුලය (Payroll Module) — 95% ගිණුම්කරණ පද්ධති මොඩියුලය (Accounting System Module) — 40% ගබඩා කළමනාකරණය (Stores Management) — 65% (එක් ගනුදෙනු සාම්පලයක් භාවිතා කොට පරීක්ෂා කරන ලදි) එසේම මේ සම්බන්ධ සියලු පාර්ශවයන් එකතු කර ගැටළුකාරී තත්ත්වයන් විසඳාගැනීම සඳහා කටයුතු කර ඇති අතර 2024 වර්ෂය අවසාන වන විට මෙම ගිණුම්කරණ පද්ධතිය ස්ථාපිත කර භාවිතා කිරීමට හැකි සෑම පියවරක්ම ගනු ලැබේ.

මාහචාර්ය ඩී.කේ.එන්.ජී.පුෂ්පකුමාර
අධ්‍යක්ෂ
කෘෂිකර්මවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය